දෙසැම්බර් 2025







# කොළඹ නගරයේ සමාජ ආරක්ෂණය සහ නාගරික සුරැකුම් යටිතල පහසුකම්

ඉරෝමි පෙරේරා | මෙගාල් පෙරේරා







COLOMBO URBAN LAB

CENTRE FOR A SMART FUTURE

unicef for every child
සෑම දරුවෙක් වෙනුවෙන්ම

# හැඳින්වීම

ශ්‍රී ලංකාවාසීන්ට 2020 වසරේ දී සිදුවූ බහු රූපී ව්‍යසනයන් හේතුවෙන් පෙර නොවූ විරූ කම්පනයකට මුහුණ දෙන්නට සිදුවිය. පසුව ආර්ථිකය වැඩි දියුණු වීමත් සමඟ, ඇතැම් අයට ඊට අනුගතව සමථයකට පත්වන්නට හැකි වුව ද, කොළඹ අර්බන් ලැබ් (Colombo Urban Lab) පර්යේෂණායතනය විසින් කොළඹ නගරයේ දැනට සිදු කෙරෙන පර්යේෂයන්ට අනුව, නගරයේ කම්කරු වෘත්තීය පාන්තික දිළිඳු ජනතාව සහ අවිධිමත් වෘත්තික කණ්ඩායම වෙත, එම කම්පනයන්ගේ දිගු කාලීන බලපෑම් පවතී. ස්ථාවර ආර්ථික දර්ශනයන් පැවතිය ද, පෝලිම්වල සිටි යුගය අවසන්ව ඇත ද, ඉගෙනුම් අවස්ථා නොමැතිකම, දේපල අහිමිවීම, පෝෂණය හා සෞඛ්‍යය පිරිහීමට ලක්වීම, දිළිඳුකම වර්ධනය, විවේක කාලයක් නොලැබීම සහ ජීවිතයේ ගුණාත්මක භාවය පිරිහීම ආදී හේතූන් නිසා, මෙම ගෘහවාසීන් හා ප්‍රජාවන් තවදුරටත් බහුරූපී ව්‍යසනයන් ගේ බලපෑමට ලක්ව සිටිති.

කොළඹ නගරයේ අපගේ පර්යේෂණයන් මඟින් ඉස්මතු වූ කාරණය වන්නේ, එම ව්‍යසනයන්ගේ බලපෑම දැඩි ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදු වී ඇති බවයි. විදුලිය සැපයුම සඳහා අයකිරීම් ඉහළ දැමීම නිසා රෙදි සෝදන යන්ත්‍ර, බත් පිසින විදුලි උපකරණ ආදී කාලය ඉතිරි කරන විදුලි උපකරණ භාවිතය සිදු නොකිරීම හා එම කාර්යයන් අතින් සිදු කිරීම, මිල ගණන් ඉහළ යද්දී ඔවුන්ගේ (සහ ඔවුන්ගේ පවුල් සාමාජිකයන් ගේ පවා) පෝෂණය ලබා ගැනීම නොතකා හැරීම, අමතර හෝ නව ආදායම් ලබන ක්‍රියාකාරකම් සිදු කිරීම යනාදී හේතු නිසා මෙම ගෘහයන්වල කාන්තාවන් ගේ කාලය වැයවීම (කාල දරිද්‍රතාව) බෙහෙවින් වර්ධනය වී ඇත. එමෙන්ම සාම්ප්‍රදායික සහායක සමාජ ජාලයන්ගේ හා රාජ්‍ය සේවාවන්ගේ ගරා වැටීම් නිසා, වයස්ගතවූවන්, ළදරුවන්, නිදන්ගත රෝගී පවුල් සාමාජිකයින් හා ආබාධ සහිත පුද්ගලයින් රැක බලා ගැනීමට ද වැඩි දායකත්වයක් ලබා දීමට සිදු විය. සෞඛ්‍ය සත්කාරයන් හා ඖෂධවල වියදම් අධික වීම නිසා ගෘහයන්, විශේෂයෙන්ම කාන්තාවන්, අත්‍යාවශ්‍ය ඖෂධ ලබා ගැනීම අවම කිරීම හා බොහෝ විට අතහැර දැමීම සිදු වූ අතර, එය ඔවුන්ගේ ආයු කාලය හා ජීවන තත්ත්වය කෙරෙහි තදබල බලපෑමක් බවට පත්විය. ගෘහස්ථ ණය හා පවතින ඉහළ වියදම්වල පීඩනය ඔව්හු තවදුරටත් දරාගෙන සිටිති.

ව්‍යසන කාලය තුළ පැහැදිලි වූයේ රට තුළ සමාජ ආරක්ෂණ පද්ධතිය, පවුල්වල හා අවශ්‍ය විවිධ අංශයන්වලට සහාය වීම කිසිසේත් ප්‍රමාණවත් නොවූ බවයි. පවතින සමාජ ආරක්ෂණ පද්ධතීන්ට ප්‍රමාණවත් ලෙස අරමුදල් සැපයීම සිදු නොවූවා පමණක් නොව, තොරතුරු හිඟතාවය, බෙහෙවින් ඛණ්ඩනය වීම, ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් නොමැති වීම, ව්‍යුහාත්මක ගැටළු හඳුනා ගැනීමට හෝ ජනතාව අනතුරට ලක්විය හැකි මාර්ග හඳුනාගැනීමට හෝ සහාය වීමට ශක්තිමත් හෝ ගතික බවක් නොමැති වීම ද නිරීක්ෂණය විය (පෙරේරා 2025). ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණය සඳහා ප්‍රවේශය පරිවර්තනීය වීම සඳහා, එය සමාජ සමානාත්මතාවය මත පදනම්ව විය යුතු වන අතර, ඒ තුළ අවදානම් තත්ත්වයන් දිරිමත් කරන, ඇති කරන හා පවත්වාගෙන යන සමාජයේ බල අසමතුලිතතාවයන් ආමන්ත්‍රණය කරන ප්‍රතිපත්තීන් ද තිබිය යුතුය (දෙවරෝ සහ සැබට්ස්-වීලර්, 2004). ස්ටීවන් දෙවරෝ සහ රේචල් සැබට්ස්-වීලර් ගේ සමාජ ආරක්ෂණය පිළිබඳ අධ්‍යයනයන්හි, ඔවුන් ඉලක්කගත මුදල් හුවමාරු සහ රක්ෂණ යෝජනා ක්‍රම වැනි සමාජ ආරක්ෂක ක්‍රමවේද, ආර්ථික ආරක්ෂාව ලෙස හඳුනගත් අතර, ඒවා ඇත්ත වශයෙන් සමාජ ආරක්ෂණ ක්‍රමවේද නොවන බවත් හඳුනාගෙන ඇත. සමාජ ආරක්ෂාව සඳහා අවශ්‍යතාවය පිරිහීමට ලක්වන හෝ උච්චාවචනය වන ආදායම සඳහා ප්‍රතිචාරයක් ලෙස පරිභෝජන සුමට කිරීමේ ක්‍රමවේදයන් ලෙසත්, පටු ආකාරයෙන් "ආරක්ෂක දැලක්" ලෙස අර්ථ දක්වා ඇත්නම්, එමඟින් මතු වන මැදිහත්වීම්වල ඉලක්කය තර්කානුකූලව ඉලක්කගත ආදායම මත හෝ බලපෑමට ලත් අයවලුන්ට පාරිභෝජන හුවමාරු කිරීම කෙරෙහි යන බව ඔවුන් අවධාරණය කළහ.

කම්කරු පන්තියෙහි දුප්පත් වැසියන් සහ අවිධිමත් අංශය විවිධාකාර හා ගතික වෙති. මීට ප්‍රතිචාරයක් ලෙස, සමාජ ආරක්ෂණය, සමාන්තර හා ප්‍රවර්ධන ආකාරයෙන් ක්‍රියාත්මක වන ආයෝජනයන් හා

මැදිහත්වීම්වල පද්ධතියක් ලෙස දැකිය යුතුය. පසුගිය වසර කීපය, ලෝක කම්පනයන්ගෙන් ජනිතවන සංකීර්ණ ගැටලු, කප්පාදු ක්‍රමවේද සහ මුල්‍ය ගලපා ගැනීම් හේතුවෙන් මහජනතාව වෙත ඇතිවන බලපෑම සුබ සාධක ක්‍රමවේද එකක් හෝ කිහිපයක් මඟින් සමථ කර ගත නොහැකි බවට වැදගත් සිහිපත් කිරීමකි. ආර්ථික අර්බුදය අතරතුර මුල්‍ය හුවමාරුවක් ලැබීම වැදගත් වුවද, එමඟින් ජනතාවට මූලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනිමට පමණක් ඉඩදුන් නමුත්, එමඟින් පෝෂණය, ඉගෙනීම අහිමි වීම හෝ ජීවනෝපාය යනාදියට සහාය වීමක් සිදු නොවීය. ව්‍යසන කාලය තුළ විදුලි භාවිතය 75% කින් පමණ වැඩි වූ හෙයින් අස්වැසුම ගෙවීම් බොහොමයක් සෘජුවම උපයෝගීතා ගෙවීම් විශේෂයෙන් විදුලි සැපයුම සඳහා යොදා ඇති බව කොළඹ අර්බන් ලැබ් පෙන්වා දුන්නේ ය. ඉලක්කගත යෝජනා ක්‍රම මඟින්, දරිද්‍රතාවය සහ අවදානම් සහගත බව යනාදිය එක්තරා ආකාරයකින් පරිකල්පනය කරන නිසා, ස්ථිර නිවාස හෝ ඉහළ තලයේ අධ්‍යාපනය අහිමි වීම හෝ නොමැති වීම වැනි කාරණා මත එහි දර්ශකයන් දක්වයි. කෙසේ වුව ද, දේපල සහිත අයට පවා ආරක්ෂක ජාලයක අවශ්‍යතාවය ඇතිව සිටිය හැක. ඇතැම් සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම නිසා අර්බුද සමයක ජනතාවකට හිමි සමාජ ආරක්ෂාව අහිමි කිරීම, ඔවුන්ගේ සමාජ-ආර්ථික අයිතිවාසිකම් අහිමි කිරීමකි.

ජීවනෝපායන්හි අස්ථිර බව හා අවිධිමත් අංශයේ සේවකයන් සඳහා කම්කරු ආරක්ෂණය නොමැති වීම, අර්බුද තත්ත්වයන් ට යොමු විය හැකි අවධානම තීව්‍ර කර ඇත. සෞඛ්‍යය හා පෝෂණය දුර්වල විම කම්කරු පන්තියෙහි වැසියන්ගේ කම්කරු බලය කෙරෙහි බලපෑම් සිදු කරන අතර, ඔවුන්ගෙන් බොහෝ අය, නිශ්චිත වශයෙන් අර්බුද සමයන්හි දී සමාජ ආරක්ෂාව නොමැතිවිම, රෝගී තත්ත්වයන්, නොහැකියාවන්, අනතුරු සිදු විම හා මහළු වයස ආදී හේතු නිසා නිෂ්පාදන වත්කම් නොදරති.

ශ්‍රී ලංකාවෙහි සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් ඓතිහාසිකව ආර්ථික ආරක්ෂාව (උදා. මුල්‍ය බැර කිරීම, පෝෂණ මල්ල, සලාක), වෙත ඉලක්කගත වූ අතර 2024 ජාතික සමාජ ආරක්ෂක ප්‍රතිපත්තිය, විශ්ව ජීවන චක්‍ර ප්‍රවේශය නිර්දේශ කරන අතර, දරාගත හැකි, ප්‍රවේශ විය හැකි සමාජ ආරක්ෂණයක අවශ්‍යතාවය ඉස්මතු කරයි (ජාතික සමාජ ආරක්ෂන ප්‍රතිපත්තිය, 2024, 4 වන පිටුව). ජාතික සමාජ ආරක්ෂන ප්‍රතිපත්තිය 2025 ඔක්තෝබර් මස නිකුත් කරන ලද අතර, එය ආර්ථික ආරක්ෂාව අභිබවා යාමට අපේක්ෂා කරයි. නිසි සම්පත්, ප්‍රමාණවත් අයවැයක් සහ දේශපාලන අනුමැතියක් සමඟ නිසි ලෙස ක්‍රියාත්මක කළහොත් එය ශ්‍රී ලංකාවාසීන්ට දිගු කාලීනව ශක්තිමත් සහායක ක්‍රමවේදයක් විය හැකිය. මෙම පර්යේෂණයට සුවිශේෂීව, සමාජ ආරක්ෂාව සඳහා උපාය මාර්ගික අරමුණු දෙකක් එහි බෙහෙවින් ශක්තිමත්ව අනුනාද විය. මුල්‍යමය, මනෝවිද්‍යාත්මක හා ආයතනික සහාය ක්‍රමවේදයන් මඟින් අවිධිමත් සුරැකුම් සපයන්නන් ශක්තිමත් කිරීම සහ අවසන් සැතපුම කරා ළඟා කරවීම සඳහා දේශීය රාජ්‍ය නිලධාරීන් සහ ස්වේච්ඡා දායකයින් උත්තේජනය කරමින් ප්‍රජා පාදක සුරැකුම් ජාලයන් ව්‍යාප්ත කිරීම.

# ශ්‍රී ලංකාවේ ළමා සුරැකුම පිළිබඳ ප්‍රතිපත්ති වපසරිය

ශ්‍රී ලංකාවේ නීතිමය රාමුව ළමුන් පිළිබඳ රජයේ වගකීම හඳුනාගෙන ඇති අතර, ශ්‍රී ලංකාව ළමුන්ගේ අයිතීන් පිළිබඳ, 1990 එක්සත් ජාතින්ගේ ළමා අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (UNCRO) ඇතුළු සුවිශේෂී ජාත්‍යන්තර නීතිරාමුවලට ද අත්සන් කර එකඟ වී ඇත. පසුකාලීනව, ශ්‍රී ලංකා රජය විසින් ළමා අයිතිය පිළිබඳ ප්‍රඥප්තිය 1992 දී හඳුන්වා දෙන ලදි. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවට අනුව පවා රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම මඟින් “රජය විශේෂ අවධානයකින් යුතුව ළමුන් හා තරුණයින්ගේ පූර්ණ වර්ධනය සහතික කිරීමට, ශාරීරික, මානසික, සදාචාරාත්මක, ආගමික, සහ සමාජ අවශ්‍යතා ප්‍රවර්ධනය කළ යුතු වන අතර, අපචාරය හා අවභාවිතය නොවන පරිදි ආරක්ෂා කළ යුතුයැ”යි (VI පරිච්ඡේදය, 27(13) වගන්තිය) අවධාරණය කළ ඇත.

ළමා සුරැකුම පරිපාලනය කරනු ලබන ජාතික තලයේ ප්‍රතිපත්තීන්ට ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අපරාධ වැළැක්වීම සඳහා වූ ජාතික සැලැස්ම හා ප්‍රතිපත්ති රාමුව (2016-2020), විකල්ප ළමා සුරැකුම පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය (2019), ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය (2019) මුල් ළමාවිය සුරැකුම හා සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය (2018) මෙන්ම, ඇමති මණ්ඩල අනුමැතිය අනුව යාවත් කාලීන කිරීමට 2024 දී කෙටුම්පත් කර ඇති දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික මාර්ගෝපදේශය (2017), ආදිය ඊට ඇතුළත්ය. ශ්‍රී ලංකාව ළමා සුරැකුම පරිපාලනය සඳහා බහු පාර්ශ්වික ප්‍රවේශයක් බලාත්මක කරන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, ළමා සුරැකුම විෂයය ජාතික තලයේ දී, කාන්තා හා ළමා ආරක්ෂණ අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය ආදී අමාත්‍යාංශ කිහිපයක විෂයපථයන්ට ඇතුළත් වෙයි (වර්ණසූරිය et al. 2020). ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCP), ජාතික මුල් ළමාවිය සංවර්ධන ලේකම් කාර්යාලය (NSECD) සහ පරිවාස සහ ළමා ආරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව (DPCS), රට තුළ ළමාරක්ෂණ රෙගුලාසි හා පහසුකම් හා අදාළ පර්යේෂණ කිරීමට, සකස් කිරීමට, බලාත්මක කිරීමට, ක්‍රියාත්මක කිරීමට වගකීම දරයි. NSECD කාර්යාලයේ විශේෂ වගකීම වන්නේ ළමා දිවා සුරැකුම් ආයතන සඳහා මුල් ළමාවිය සංවර්ධනය (ECD) හා අදාළ ආරක්ෂණ ප්‍රතිපත්ති හා රෙගුලාසි සකස් කිරීමයි. NCPA අධිකාරිය, ආයතන අධීක්ෂණය, මනෝ සාමාජීය සේවාවන්, නීතිමය හා නීතිය ක්‍රියාත්මක කිරීමේ සේවාවන්, ක්ෂණික ඇමතුම්, විශේෂ පොලිස් ඒකකය ආදිය අදාළ අධිකාරිය ලෙස ක්‍රියාත්මක වෙයි. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ (1987) 154G(1) වගන්තිය යටතේ පලාත් සභාවලට පෙර පාසල් කළමනාකරණය හා අධීක්ෂණය කිරීමට රෙගුලාසි පැනවිය හැකි අතර, පළාත් නමය අතුරින් හයක් (උතුරුමැද, බස්නාහිර මැද, සබරගමුව, දකුණ, ඌව හා බස්නාහිර) මුල් ළමාවිය සුරැකුම හා අධ්‍යාපන මධ්‍යස්ථාන (උදා. දිවාසුරැකුම් මධ්‍යස්ථාන) හා පෙර පාසල් සඳහා මාර්ගෝපදේශ හා නිසි ප්‍රමිති පිහිටුවා ඇත (වර්ණසූරිය et al. 2020) කොළඹ මහනගර සභාවේ මහජන ආධාර දෙපාර්තමේන්තුව ළමා නිවාස 2 ක් හා පෙර පාසල් 13 ක් කොළඹ නගරයෙහි පවත්වාගෙන යනු ලබන අතර, පෙර පාසල් 27 ක් සඳහා පරිපූරක ප්‍රතිපාදන සැපයීමද සිදු කරයි (කොළඹ මහනගර සභාව 2025).

මෙම ආයතනික රාමු තිබියදී ද, ළමා සුරැකුම සම්බන්ධ යටිතල පහසුකම් බොහොමයක් පෞද්ගලික පාර්ශ්වයන් යටතේ ක්‍රියාත්මක වෙයි. සුරැකුම සම්බන්ධ පහසුකම් පිළිබඳව, 2016 වසරේ දී සිදු කළ නවතම සමීක්ෂණයකට අනුව, දිවයින පුරා දිවා සුරැකුම් මධ්‍යස්ථාන 1209 ක ළමුන් 23365 කට සේවා සැපයෙයි. මෙම මධ්‍යස්ථාන අතුරින් බහුතරයක්, කොළඹ (189) හා කුරුණෑගල (200) දිස්ත්‍රික්කයන්හි පිහිටා ඇත (NCP 2024). 2016 ECD සමීක්ෂණයට අනුව ළමා සුරැකුම් පහසුකම් අතුරින් 70.8 % ක ප්‍රමාණයක් පෞද්ගලිකව ක්‍රියාත්මක වන අතර, 6.5 % ක් ආගමික ආයතන හා 3 % ක් රාජ්‍ය නොවන ආයතන (NGOs) මඟින් ක්‍රියාත්මක වේ. කෙසේ වුව ද, පෞද්ගලික ECD මධ්‍යස්ථාන සඳහා වැය වන මුදල- ගෙවීම් වැනි ඍජු වියදම් සහ ප්‍රවාහනය, ලිපි ද්‍රව්‍ය සහ ඇඳුම් වැනි ඍජු නොවන වියදම් දරුවන් ඇතුළත් කරන මව්පියන්ට සැලකිය යුතු බාධකයක් වෙයි. තවදුරටද, COVID-19 වසංගතය, 2021 ආර්ථික අර්බුදය වැනි මෑත කාලීන සිදුවීම් මෙම ආර්ථික අභියෝගයන් උත්සන්න කර ඇත (නවරත්න 2023). 2016 ECD සංගණනය අනුව, මහජන

අරමුදල් යොදවන ECD මධ්‍යස්ථානවලට ගමනාගමන පහසුකම් නොමැතිකම, පෞද්ගලික අංශයේ මධ්‍යස්ථානවල ඉහළ පිරිවැය ආදී හේතූන් නිසා, ආසන්න වශයෙන් ළමයින් අතුරින් 44% ක් පමණ ECD මධ්‍යස්ථානවලට ඇතුළත් කර නොමැත. NCPA තවදුරටත් සඳහන් කර ඇත්තේ විවිධ වයස් කාණ්ඩවල දරුවන්ට පහසුකම් සැපයීමට හා මව්වරුන්ගේ අවශ්‍යතාවයන් අනුව, මධ්‍යස්ථාන ආශ්‍රිත, නිවාස ආශ්‍රිත හා සේවා ස්ථාන ආශ්‍රිත විවිධ ආකාරයේ ECD මධ්‍යස්ථානවල අවශ්‍යතාවය පවතින බවයි (NCPA 2024). අංශ කිහිපයක පමණක්, ස්ථානයෙන් බැහැර හා ස්ථානගත පියවුරු කිරි පෙවීමට කාමර, ළදරු සුරැකුම් මධ්‍යස්ථාන සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආදී පූර්ව ළමාවිය වයසේ දරුවන් සඳහා පහසුකම් පවතී. කෙසේ වුවද, සේවා යෝජකයින් විසින් ලබා දෙන ළමා සුරැකුම් සේවා සඳහා අවිධිමත් අංශයේ සේවය කරන කාන්තාවන්වන්ට ප්‍රවේශ විය නොහැක. NCPA තවදුරටත් අවවාද කරනු ලබන්නේ නිවාස පදනම් වූ, පාලන අධීක්ෂණයක් හා සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් නොමැති ළමා සුරැකුම් මධ්‍යස්ථාන භාවිතා නොකරනු ලැබිය යුතු බවයි (NCPA 2024).

# රැකියාවල යෙදී සිටින මව්වරුන් හා කොළඹ පවතින නාගරික සුරැකුම් යටිතල පහසුකම්

මෙම පර්යේෂණය, සමාජ සුරැකුමෙහි වැදගත් සාධකයක් වන නාගරික සුරැකුම් යටිතල පහසුකම් කෙරෙහි අවධානය යොමු කෙරෙන අතර, සුරැකුම සපයන්නාගේ සේවයට සහාය දෙන හෝ බාධා කරන නාගරික පරිසරයෙහි විශේෂ පැතිකඩයන් සලකා බලනු ලබයි. අඩු ආදායම්ලාභී නිවාසයන් හි නාගරික කාන්තාවන් අවිධිමත් අංශවල රැකියාවල යෙදී සිටීමට වැඩි හැකියාවක් ඇති අතර ඔවුන් අවිනිශ්චිත ආදායම් ලබමින්, නියමිත සේවා ස්ථානයකින් ලැබෙන ආරක්ෂාණයන් සහ ප්‍රතිලාභ වන මාතෘ නිවාඩු, විශ්‍රාම ප්‍රතිලාභ ආදිය නොලබති. තවද, ඔවුන්ට ගෘහස්ථ වැඩ කටයුතු සහ ළමා සුරැකුම යනාදී වැටුප් නොලබන සුරැකුම් වැඩ ඔවුන්ට පිට පාර්ශවයකට ලබා දීමට නොහැක; ඒ එම ශ්‍රමය මධ්‍යම පාන්තිකයන් සඳහා ලබා දී ඇති නිසාය. රැකියාව, ආදායම් උපදවන ක්‍රියාවක් ලෙස අර්ථ දක්වමින්, මෙම පර්යේෂණය මඟින් විමසන ලද්දේ කොළඹ කම්කරු පන්ති ජනාවාසවල රැකියාවල යෙදෙන මව්වරුන් ගේ ජීවිත ස්වභාවයයි. කාන්තාවන් විසින් දරු සුරැකුම් විකල්ප තෝරාගන්නේ සහ අතහැර දමනු ලබන්නේ කෙසේද හා කුමක් නිසාද යන්න අප විසින් විමසනු ලැබූ අතර, කම්පනයන් මඟින් සුරැකුම් බර සංකීර්ණ වූ විට ඔවුන් නිවසේ හා සේවා ස්ථානයේ තත්ත්වයන්ට අනුගත වන්නේ කෙසේද, ඔවුන්ගේ යහ පැවැත්ම, සුරැකුම් කටයුතු හා ආදායම් කටයුතු සමතුලිත කර ගැනිමේ දී බලපෑමට ලක්ව ඇති ආකාරයද අධ්‍යයනය කරන ලදි.

අපගේ පර්යේෂණයට මගපෙන්වූ මූලධර්ම දෙක-

පළමු මූලධර්මය වන්නේ, සුරැකුම් වෙත මුදල් ආයෝජනය සහ වැටුප් නොලබන සුරැකුම් කටයුතු කළ යුත්තේ එය සාමූහික සහායක් සහ මහජන මුදල් යෙදවීමෙන් ඉටු කළ යුතු මිනිස් අයිතිවාසිකමක් නිසා වන අතර, එය කාන්තාවන්ට ශ්‍රම බලකායට එක්වීමට හැකියාව ලබා දෙන නිසා පමණක් නොවේ. සුරැකීම අත්‍යාවශ්‍ය වන අතර, ඒ සඳහා වැටුප් නොගෙවුවද, සම්පත් අවම වුවද, අගැයීමට ලක් නොවුවද, ලොව වෙනත් ආකාරයේ ශ්‍රමය මෙන් නොව සුරැකුම තවදුරටත් නිරන්තරයෙන්ම සිදුවේ.

දෙවන මූලධර්මය වන්නේ, සුරැකීමට මුදල් ආයෝජනය, කාන්තාවන් ගේ සමස්ථ මානසික සහ ශාරීරික යහපැවැත්මට පමණක් ප්‍රතිලාභ ලබා නොදෙන අතර, ඔවුන්ගේ දරුවන්ගේ, පවුලේ සාමාජිකයින්ගේ සහ සමස්ථ ප්‍රජාවගේ, යහපත් සෞඛ්‍යයකට හා ගෞරවනීය ජීවිතයකට ද හේතුවෙයි. අපගේ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් වෙන් කළ නොහැකි ය. ඒවා ඉහළ නැංවෙන්නේ ද, පහත නැංවෙන්නේ ද එකට ය.

# පර්යේෂණ ක්‍රමවේදය

2025 ජූනි සිට නොවැම්බර් මාසය දක්වා, කොළඹ අර්බන් ලැබ් කණ්ඩායම නගරයේ සුරැකුම් කටයුතුවල යටිතල පහසුකම් සහ නාගරික කම්කරු පාන්තික ප්‍රජාවට සහාය වීමට ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂාවේ කුමන සාධකයන් වඩාත් ශක්තිමත් විය යුතුද යන්න පිළිබඳ අවබෝධ කර ගැනීමට, හා විශ්ලේෂණය කිරීමට ආසන්න වශයෙන් නගරවාසීන් 200 දෙනෙකු සමඟ සෘජුවම සම්බන්ධ වන ලදි. අපගේ බහුවිධ ක්‍රමවේද ප්‍රවේශයට, රැකියාවෙහි යෙදෙන මව්වරුන් සමඟ ගුණාත්මක සම්මුඛ පරීක්ෂණ, කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා, සහ මානව කේන්ද්‍රීය සැලසුම් ක්‍රමවේද භාවිතා කර සැලසුම් කළ වැඩමුළු ඇතුළත් විය. මෙහි අරමුණු වූයේ ශ්‍රී ලංකාවෙහි වඩාත් ශක්තිමත් සමාජ ආරක්ෂාෂණයක් අර්ථාන්විතව අධ්‍යයනය කිරීමට සහ ඒ සඳහා එක්ව නිර්මාණය කළ ඉදිරි මගක් සකසා ගැනීමයි.

### ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සම්මුඛ පරීක්ෂණ සය-

ප්‍රධාන තොරතුරු සම්මුඛ පරීක්ෂණ 6 ක් අප විසින් ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන් සහ ළමා සුරැකුමෙහි විවිධ තනතුරුවල සේවය කරන අයවළුන් සමඟ පවත්වන ලද අතර, එමඟින් ප්‍රශ්ණාවලිය හා සමස්ථ පර්යේෂණ රාමුව පිළිබඳව දැනුවත් කරන ලදි.

### ගෘහාශ්‍රිත සම්මුඛ පරීක්ෂණ හතලිස් පහ-

කොළඹ අර්බන් ලැබ් කණ්ඩායම මරදාන, ගුණසිංහපුර, කොම්පඤ්ඤ වීදිය සහ වනාතමුල්ලෙහි ස්ථාන 4 ක දී, රැකියාවෙහි යෙදී සිටින මව්වරුන් සමඟ අර්ධ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ 45 ක් 2025 ජූනි මස සිට 2025 සැප්තැම්බර් මස දක්වා කාලය තුළ පවත්වන ලදි. විවිධ ළමා සුරැකුම් ක්‍රම, රැකියාවෙහි යෙදෙන ආකාර, ජනවර්ග ආදිය නියෝජනය වීම සහතික වන පරිදි, අරමුණු සහිත සහ හිමබෝල නියැදි ක්‍රම (Snowball sampling method) ඒ සඳහා යොදා ගන්නා ලදි. ස්ථාන තෝරා ගැනීමේදී, අඩු ආදායම්ලාභී නිවාස හා මහල් නිවාස පැවතීම මත තේරීම කළ නිසා, නියැදීම්වලට ආදායම ඇතුළත් නොකරන ලද අතර, එහි ප්‍රතිපලයක් ලෙස ප්‍රතිචාර දක්වන්නන්ගෙන් සුළුතරයක් අඩු ආදායම් ලාභී නිවාසවාසීන් ලෙස සැලකිය නොහැක. එක් එක් ස්ථානයෙහි විවිධ උපක්‍රම යොදාගනිමින්, රැකියාවල යෙදී සිටින මව්වරුන් මුහුණ දුන් විශේෂිත ළමා සුරැකුම් අවශ්‍යතාවයන් හා ඊට ඔවුන් ලබා දුන් විසඳුම් හඳුනාගන්නා ලදි. මරදානහිදී, නියැදීම සිදුකරමින්, ප්‍රදේශයේ පෙර පාසලක් භාවිතා කළ හා නොකළ මව්වරුන්ගේ මිශ්‍ර කණ්ඩායමක් තෝරා ගන්නා ලදි. වනාතමුල්ලෙහි දී, ප්‍රජා සාමාජිකයින් එක් මහල් නිවාස සංකීර්ණයකින් සහභාගිවන්නන් තෝරා ගන්නා ලද අතර, එමඟින් වෙනස්ව ගොඩනැගුනු පරිසරයක් වෙත නැවත ස්ථානගත කිරීමෙන් එය සුරැකුම් ජාලයේ ළමා සුරැකුම් ක්‍රම කෙරෙහි බලපාන අයුරු වටහා ගන්නා ලදි. කොම්පඤ්ඤ වීදියේ සහ ගුණසිංහපුරහි දී, ප්‍රජා නායකයින් නිවාසවලින් පිටත රැකියාවෙහි යෙදී සිටින සහභාගිවන්නන් තෝරා ගන්නා ලද අතර, ගෘහස්ථ සේවකයින් වැඩිපුර නියැදිගත කරන ලදි.

### කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා තුන-

ආබාධිත දරුවන් ගේ මව්වරුන් 15 දෙනෙකු ඇතුළත් සහභාගිවන්නන් 37 ක් සහිත කේන්ද්‍රීය කණ්ඩායම් 3 ක් සමඟ අප විසින් සාකච්ඡා පවත්වන ලදි. ඉතිරි සහභාගිවන්නන් 22, නිවාස සම්මුඛ සාකච්ඡාවල කොටසක් විය. පර්යේෂණයේ අනාවරණයන්, පුළුල් විශ්ලේෂණයක් හා නිර්දේශයන් සහභාගිවන්නන්ට ඉදිරිපත් කරන ලද අතර, ඔවුන්ගේ නිරීක්ෂණ හා ස්වයං නිර්දේශයන් මෙම වාර්තාවේ අවසන් විශ්ලේෂණයේ දී නිර්දේශයන් සඳහා සලකා බලන ලදි.

## වලංගු කිරීමේ වැඩමුළු හතර-

කොලඹ නගරය පුරා ජනාවාස හා මහල් නිවාස නියෝජනය කළ ප්‍රජා නායකයින් 20 දෙනෙකු සමඟ අප විසින් වලංගු කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදි. ඔවුන් තම ප්‍රජාවන් සමඟ බෙහෙවින් සමීපව කටයුතු කරන හෙයින් හා ප්‍රධාන තීරණවලට එළඹෙන්නන් නිසා, අප විසින් අපගේ ප්‍රධාන අනාවරණය කර ගැනීම් හා නිර්දේශයන් ඔවුන්ට ඉදිරිපත් කරන ලද අතර, අවසන් ප්‍රතිඵලය ඔවුන්ගේ ප්‍රතිචාරයන් මත පදනම්ව ප්‍රතිශෝධනය කරන ලදි. ඒ හා සමානව 2025 නොවැම්බර් මාසයේ දී, අප විසින් පංචිකාවත්ත, වනාතමුල්ල, මට්ටක්කුලිය යන ප්‍රදේශවල දී සහභාගිවන්නන් 85 දෙනෙකු සඳහා සමාජ ආරක්ෂාව පිළිබඳව වැඩමුළු 4 ක් පවත්වන ලද අතර, එහි දී වාර්තාවේ ප්‍රධාන නිර්දේශ පිළිබඳව ඔවුන්ගේ අදහස් හා අනුමැතිය පිළිබඳව විමසන ලදි. මෙම වැඩමුළුවල දී විශේෂයෙන්ම පරිවර්තනීය සමාජ ආරක්ෂා සංකල්පයන් පිළිබඳව ප්‍රජාවන් දැනුවත් කිරීමට, ඔවුන් මුදල් උපයන වැඩසටහන්වලට වඩා අර්ථවත් වන බව දැනුවත් කිරීමට හා එම අදහස් කම්කරු පන්තියේ ජනතාවගේ ජීවන චක්‍රයට ව්‍යවහාර කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳව අවධානය යොමු කරවන ලදි.

# පරිවර්තනීය සමාජ ආරක්ෂාව දෙසට: ශ්‍රී ලංකාවේ නාගරික සුරැකුම් යටිතල පහසුකම් ශක්තිමත් කිරීම

මෙම කොටසෙහි, නාගරික සුරැකුම් යටිතල පහසුකම්වලට හා කම්කරු පන්තියේ මව්වරුන්ට විශේෂ අවධානයක් යොමු කරමින්, ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ක්‍රමවේදයන් ශක්තිමත් කිරීම සඳහා නිර්දේශයන් ගණනාවක් ඉදිරිපත් කෙරෙයි. කාලය සමඟ සමාන්තරව හා වර්ධනීයව ක්‍රියාවෙහි යෙදවුවහොත්, මෙම නිර්දේශයන් මඟින් පවුල් මත පවතින පීඩනයන් අවම කර, ජීවනෝපායෙහි දිගු කාලීන ලැබීම් ඇති කර, සෞඛ්‍යය, අධ්‍යාපනය, හා සමාජ සම්බන්ධතා ශක්තිමත් කරනු ඇත. එමඟින් කාන්තාවන් ගේ කාලය හිඟකම අවම කර ජීවන තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට හා විවේකය සඳහා කාලය ලබා ගැනීම සහ තම තෝරා ගැනීම තුලින් ආර්ථිකව ක්‍රියාකාරීවීමට ද හැකිවනු ඇත. අපගේ සමාජ ආරක්ෂණ වැඩමුළුවල දී අප විසින් අවධාරනය කරනු ලැබුවේ, සමාජ ආරක්ෂාව අයිතියක් බව හා පිණට ලබා දෙන්නක් නොවන බවත්, නිවෙස්වල ජීවත්වන පුද්ගලයින්ට පාසල් යාමට, වැඩපොළට යාමට සහ සමාජයේ ක්‍රියාකාරී සහ සෞඛ්‍යසම්පන්න පුරවැසියන් ලෙස කටයුතු කිරීමට හැකි වන්නේ නිවෙස තුළ සිටින (රැකියාවල යෙදෙන හෝ නොයෙදෙන) කාන්තාවන් ඔවුන්ගේ වැටුප් නොලබන ශ්‍රමය මඟින් එයට මඟ පෑදූ නිසා බවත් ය.
2025 නොවැම්බර් මස, සමාජ සංවර්ධනය පිළිබඳ දෙවන ලෝක සමුළුවේ දී, එක්සත් ජාතීන්ගේ උෂ්ඨ දිළිඳුකම හා මානව අයිතිවාසිකම් පිළිබඳ විශේෂ වාර්තාකරු, ඔලිවියර් ද ෂටර් සඳහන් කර ඇත්තේ, 2023 දි, වාර්තාගත දියුණුවෙමින් පවතින රටවල් 54 ක්, රජයේ ආදායමෙන් 10% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක්, තම ණය ගෙවීම සඳහා වෙන්කර ඇති බවත්, බිලියන 3.3 ක ජනතාවක්, අධ්‍යාපනයට හෝ සෞඛ්‍යයට වඩා ණය පොලී ගෙවීමට මුදල් වෙන් කරන රටවල වෙසෙන බවත්ය. (De Schutter, 2025).

2026 වසරේ අයවැය වාර්තාවේ සඳහන් ප්‍රධාන කරුණුවලට අනුව, 2026 වසර සඳහා ඇස්තමේන්තු කර ඇති ශ්‍රී ලංකාවේ සම්පූර්ණ ආදායම රුපියල් බිලියන 5305 ක් වන අතර, ඇස්තමේන්තු කර ඇති වියදමෙන්, රුපියල් බිලියන 4495 ක් - ඇස්තමේන්තුගත ආදායමෙන් 80% ක්, 2026 වසරේ ණය ගෙවීම සඳහා වෙන්කර ඇත. (EconomyNext, 2025). ශ්‍රී ලංකාව ආර්ථික අර්බුදයෙන් යථා තත්ත්වයට පත්වෙද්දී හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) වැඩසටහනේ ආදායම පදනම් වූ ඉලක්කයන් සපුරා ගනිද්දී, යටිතල පහසුකම් හා සංවර්ධන වැඩසටහන් වෙත මූලිකත්වය ලබා දෙමින්, ණය පියවීමේ අර්ථය රටක ආර්ථික වර්ධනය බව පෙන්වා දෙයි. සුරැකුම් යටිතල පහසුකම් ද ඇතුළුව, සමාජ ආරක්ෂණය සඳහා වැඩිපුර ආයෝජනය කිරීමට කැපවීම ප්‍රමාණවත් නොවන හා ප්‍රමුඛත්වය නොදුන් තත්ත්වයක පවතින අතර, ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය හඳුන්වා දුන් පසු ද තත්ත්වයේ වෙනස් වීමක් දක්නට නොලැබේ. 2026 අයවැය මඟින් රුපියල් බිලියන 837 ක් සමාජ ආරක්ෂණය සඳහා වෙන්කර ඇති අතර, එයින් රුපියල් බිලියන 231 ක් වෙන්කර ඇත්තේ අස්වැසුම මුදල් දායක වැඩසටහන සඳහා සහ රුපියල් බිලියන 0.35 ක් දිවා සුරැකුම් මධ්‍යස්ථාන සංවර්ධනය සඳහාය.

කෙසේ වුවද, 2020 සිට ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති ගැටළුවල බලපෑම පිළිබඳ සහ වඩාත් පුළුල්ව සමාජ ආරක්ෂණය පිළිබඳ අපගේ පර්යේෂණයන්ට අනුව, අප විසින් පුරවැසියන් ගේ ආර්ථික, සමාජමය හා සංස්කෘතික අයිතිවාසිකම් කෙරෙහි ආයෝජනය නොකරන්නේ නම්, කිසි දා සාධාරණ හා ප්‍රමාණවත් ප්‍රකෘතිමත් වීමක් සිදු නොවනු ඇත. ඉදිරි මගෙහි අප විසින් තිරසාර පද්ධති ගොඩනගා ගත යුතුවන අතර, ඒ සඳහා අප විසින් අතීත ක්‍රමවේදයන් මඟින් ලද අත්දැකීම් වෙතින් ඉගෙන, වර්ධනයක් ආරම්භ කළ යුතුය. ඒ සඳහා අප සමාජ ආරක්ෂණය, රටේ විවිධ අවශ්‍යතාවයන් ඉටු කරන අතරම පරිවර්තනීය වෙනසක් සිදු කරන වැඩසටහන් ගණනාවක පද්ධතියක් ලෙස අවබෝධ කරගත යුතුය.

සුරැකුම සහජයෙන්ම නිවාස සාධාරනයට හා දේශගුණික සාධාරනයට බැඳී පවතින අතර, අප විසින් නිර්දේශයන් සකස් කර ඇත්තේ එම ඡේදනයන් සලකා බලමිනි. කෙසේවුව ද, මේ සියල්ලේ පදනම වන්නේ,

පීතෘමූලික ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් සමාජ සම්මතයන් හා සුරැකුම් වගකීම් කාන්තාව මත පවරන සමාජ සම්මතයන් ආමන්ත්‍රණය කිරීමට ඇති අවශ්‍යතාවයයි. සම්මුඛ පරීක්ෂණ හා සාකච්ඡාවල දී අපට, 'දරුවන් නිසි පරිදි රැකබලා ගතහැක්කේ මව්වරුන්ට පමණි', 'මගේ සැමියා දරුවා ළදරු සුරැකුම් මධ්‍යස්ථානයකට හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයකට යවන්නට කැමති නෑ', 'අපේ දරුවා ගෙදර දී රැකබලා ගත හැකිව තිබිය දී, වෙනත් අයෙකු විසින් රැක බලාගත යුත්තේ ඇයි? වැනි අදහස් නිතර නිතර අසන්නට ලැබිණි. බෙහෙවින් ප්‍රගතිශීලී නීති, ප්‍රතිපත්ති හා යටිතල පහසුකම් ඇතිවිට පවා, මාතෘත්වය හා සුරැකුම හා බැඳුනු ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් සම්මතයන් නොසලකා හැරීමෙන්, කාන්තාවන්ට එවැනිම අසමානතාවන්ට හා අවස්ථා අහිමිවීමට නොකඩවා මුහුණ දීමට සිදුවේ.

ඉහත ක්‍රමවේදයේ දක්වා ඇති, අපගේ ප්‍රාථමික පර්යේෂණය මත මෙම නිර්දේශයන් පදනම්ව පවතින අතර, එම නිර්දේශ කොළඹ ජනාවාසවල කම්කරු පන්තියේ ප්‍රජාවන් හා කම්කරු මව්වරුන් මඟින් සමාලෝචනය කර අනුමත කරවාගෙන ඇත.

කොළඹ කම්කරු පන්ති ප්‍රජාවන්ට එක් ආදායමක් පමණක් ප්‍රමාණවත් නොවන අතර, බොහොමයක් දෙනා අවිධිමත් අංශයට බැඳීමට පෙළෙඹෙන අතර, අයවැය පියවා ගැනීමට දෙවන රැකියාවකට හෝ වෙළඳාමකට පිවිසෙති. කම්කරු මව්වරුන්ට විධිමත් ශ්‍රම බලකායට බැඳීමට හෝ දෛනික වැටුප් ලබන හෝ ගෘහාශ්‍රිත ව්‍යාපාරයක් වැනි අවිධිමත් රැකියාවල නිතිපතා කාලසටහනක් පවත්වාගෙන යාමට අපහසු වන්නේ ඔවුන්ගේ මෙකී සුරැකුම් වගකීම් හේතුවෙනි. කුඩා දරුවන් රැක බලාගත හැකි පවුල් සාමාජිකයෙකුගේ සහාය නොලබන අයකුට, පූර්ණ කාලීන හෝ නිතිපතා කෙරෙන රැකියාවක් කිරීමට නොහැකිය. ඔවුන් ළමයින් පාසලට ඇරලවීම සහ පාසලෙන් රැගෙන යාම, නිවසට පැමිණි පසු ඔවුන් රැකබලා ගන්නා අතර පාසල් හදිසියේම වසා දැමූ දිනවල (උදාහරණයක් ලෙස තාප ආතතිය හෝ කාලගුණික ගැටළු හේතුවෙන්) ඔවුන්ට රැකියාවට යාමට නොහැකි වේ. කාන්තාවන් නම්‍යශීලී පැය ගණනක් සහ නිවසට ආසන්නව අඩු වැටුප් සහිත හෝ සූරාකෑමට ලක් විය හැකි රැකියාවල නැඹුරු වෙති. ප්‍රතිලාභ සහ ශ්‍රම ආරක්ෂණ නොමැතිව වුවද, මිනිස්බල ආයතනවල වැඩ කිරීම වැනි අස්ථිර වැඩ අවිධිමත් අංශයේ කාන්තාවන්ට වඩාත් ආකර්ශනීය වන්නේ එබැවිනි.

අපගේ ප්‍රධාන නිර්දේශයන් තුනට ඇතුළත් වන්නේ:

1. ශ්‍රී ලංකාවේ සුරැකුම් යටිතල පහසුකම් හා සම්බන්ධ ප්‍රතිපත්තීන් සඳහා අරමුදල් යෙදවීම හා වැඩි දියුණු කිරීම
2. ගෘහස්ථ කම්කරුවන්ගේ ආරක්ෂාව සඳහා වන නීති ශක්තිමත් කිරීම
3. විශ්වීය පාසල් ආහාර වැඩසටහන්

## නිර්දේශය 1: ශ්‍රී ලංකාවේ සුරැකුම් යටිතල පහසුකම් හා සම්බන්ධ ප්‍රතිපත්තීන් සඳහා අරමුදල් යෙදවීම හා වැඩි දියුණු කිරීම

### ළදරු සුරැකුම් මධ්‍යස්ථාන සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන:

ළදරු සුරැකුම් මධ්‍යස්ථානය හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයන්ගේ අඩු භාවිතය සහ පිවිසීම, හා වැඩිමහල් සිසු දරුවන්ට පාසල් කාලයෙන් පසු වැඩසටහන් නොමැති වීම අපගේ පර්යේෂණය විසින් පෙන්වා දෙයි. පෙර පාසල්වලට ප්‍රවේශකත්වය තිබෙන මව්වරුන්ට උදෑසන කාලය තුළ අවිධිමත් අංශයේ රැකියාවකට (එනම් උදෑසන කාලයේදී සේවය කරන ගෘහස්ථ සේවකයින් ලෙස හෝ ගෘහාශ්‍රිතව ව්‍යාපාර කරමින්) සම්බන්ධ විය හැකිය. විශ්වාසය, මූල්‍යමය වශයෙන් දරාගැනීමේ හැකියාව, නිවාසයට හා රැකියා ස්ථානයට ඇති දුර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් සම්මතයන් ආදිය, පවුල් විසින් මෙම යටිතල පහසුකම්වල ප්‍රයෝජනය

ගන්නේද යන්න තීරණය කරයි.

නගරයේ සුරැකුම් යටිතල පහසුකම් තවදුරටත් ව්‍යාප්ත කළ යුතු වන අතර, ඊට අවශ්‍ය සම්පත් ලබා දිය යුතුය. මෙම මධ්‍යස්ථාන ප්‍රජාව අවට ස්ථානගත කළ යුතු වන අතර, ප්‍රජාව තුළින් කාර්ය මණ්ඩලයට බඳවාගෙන පුහුණු කර, කාන්තාවන්ට සම්පූර්ණ දිනයම සේවය කළ හැකි පරිදි කාලය දිගු කළ යුතුය. ළමයින්ගේ රැකබලා ගැනීම හා ආරක්ෂාව උපරිම වශයෙන් වැදගත් වන අතර, එමඟින් දරුවකු එවැනි මධ්‍යස්ථානයකට යවන්නේ ද නොයවන්නේද යන්න තීරණය වන හෙයින් එවැනි සේවාවක් සඳහා කාර්ය මණ්ඩලයක් පුහුණු කර විශ්වාසවන්ත භාවයක් ඇතිකර ගැනීම අත්‍යාවශ්‍ය වෙයි. ඊට අමතරව, මෙම මධ්‍යස්ථාන නියාමන ආයතනයක් මඟින් අධීක්ෂණය විය යුතුය.

## පාසල් කාලයෙන් පසු වැඩ සටහන්:

දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා ළදරු සුරැකුම් මධ්‍යස්ථාන සුරැකුම් විසඳුමක් ලෙස ස්ථානගත කර ඇත්තේ, එමඟින් කුඩා දරුවන් ඇති කම්කරු මව්වරුන්ට ශ්‍රම බලකායට එකතුවිය හැකි හෙයිනි. කෙසේ වුවද, එය අඩු ආදායම්ලාභී නාගරික ප්‍රදේශවල වෙසෙන යෞවනයන් මුහුණදෙන අද්විතීය අනතුරුදායක තත්ත්වයන් නොසලකා හරියි. යෞවන දරුවන් නිතර තනිව අතහැර දමන විට, ඇතැම් මව්වරුන් සුපරීක්ෂාකාරී වන අතර, පිරිමි දරුවන් මත්ද්‍රව්‍ය ඇබ්බැහියට පත්වීම හා ගැහැණු දරුවන් ලිංගික අතවරයන්ට ලක්වීමට ඇති අවදානම පෙන්වා දුන්හ. මහල් නිවාසවල මව්වරුන් මත්ද්‍රව්‍ය මහල් නිවාසවල පැතිර යාම ඔවුන්ගේ දරුවන්ට බලවත් ආරක්ෂක අවදානමක් ලෙස හඳුනාගත් අතර, ඔවුන්ගේ වැඩිමල් දරුවන් ඊට ඇබ්බැහි වීමට ඇති හැකියාව පිළිබඳව බිය පළ කරමින් ආරක්ෂාව පිළිබඳ කරුණු ඔවුන් පෙන්වා දුන්හ. පෙරපාසල් ගුරුවරියක වූ ලලනි, මේ වන විට වයස 14 - 16 වයස් කාණ්ඩයේ දරුවන් මත්ද්‍රව්‍ය ගැටළුවේ වැඩි අවදානමට ලක්ව සිටින බවත්, ඊට මැදිහත් වීම අවශ්‍ය බවත් සඳහන් කළාය. යෞවන පිරිමි දරුවන්ගෙන් වැඩිදෙනෙකු අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් පසු පාසල් හැර යාමට කැමැත්ත දක්වන අතර, අනතුරුව ඔවුන් බොහෝවිට රැකියා විරහිතව සිටීම හෝ ත්‍රිරෝද රථ රියැදුරන් බවට පත්වීම සිදුවෙයි.

විශේෂයෙන්ම වැඩිමල් දරුවන් සඳහා පාසල් කාලයෙන් පසු වැඩ සටහන් මව්වරුන්ට සම්පූර්ණ දිනයක් රැකියාව කිරීමට ඉඩ සලසන හෙයින් ප්‍රජාවන් විසින් ඉතා කැමැත්තෙන් පිළිගන්නා ලදි. එහි දී ඔවුන්ට නව කුසලතාවයන් හා සංස්කෘතික අංගයන්ට යොමුවන පරිදි පරිගනක පන්ති, නැටුම් පන්තිවලට සහභාගී වීමට හා පාසලෙන් ලබා දෙන තම ගෙදර වැඩ පැවරීම් නිම කරගැනීම කළ හැකිය. කලාත්මක හා ශිල්ප දැක්වීම පදනම් වූ ඉඩකඩ, පසු රැකවරණය සහිත ක්‍රීඩා පහසුකම්, ආදිය සලකා බැලීම සුදුසුය. ඇතැම් මව්වරුන් පවසා සිටියේ පාසල් කාලයෙන් පසු වැඩසටහන් පාසලේම පැවැත්වීම කෙරෙහි ඔවුන් කැමැත්තක් දක්වන බවත්, එමඟින් ඔවුන්ට දරුවන් පාසලේ සිට වෙනත් ස්ථානයකට ප්‍රවාහනය කිරීම පිළිබඳව කරදර වීමට සිදු නොවන බවත්ය. පාසල යනු ඔවුන්ට දරුවන් ගේ ආරක්ෂාව පිළිබඳව කණස්සල්ලක් නොමැති, විශ්වාසය තැබිය හැකි තැනකි. ආරක්ෂාව හා පසුගිය වසර කිහිපය තුළ ඔවුන්ගේ ප්‍රජා කණ්ඩායම් අතර මත්ද්‍රව්‍ය හා මත්ද්‍රව්‍ය භාවිතය පැතිර යාම පිළිබඳ කණගාටුව, නිරන්තරව අවධාරනය විය. 1 වැනි සිද්ධි අධ්‍යයනයෙහි ද කැපීපෙනෙන කාරණයක් වන්නේ, සාර්ථක ප්‍රජා පාදක පාසල් කාලයෙන් පසු වැඩසටහන්, විශ්වාසය, දරාගැනීම, ආරක්ෂාව, විවිධ වයස් කාණ්ඩවල දරුවන් ගේ අර්ථවත් සම්බන්ධවීම් යනාදිය ඒවායේ ක්‍රියාත්මක භාවයේ සාර්ථකත්වය තහවුරු කර ඇති බවයි.

## ආබාධ සහිත දරුවන් සඳහා සුරැකුම් යටිතල පහසුකම්:

ආබාධ සහිත දරුවන් සහ වැඩිහිටියන් සඳහා සුරැකුම් යටිතල පහසුකම් නොමැති වීම, අප විසින් ආබාධිත දරුවන් ඇති මව්වරුන් සමඟ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණවල දී අවධාරනය කරන ලද ප්‍රධාන හිඩැසක් විය. දරුණු ලෙස අසනීප වී සිටින හෝ ආබාධ සහිත දරුවන් දරන කාන්තාවන් සඳහා, එම දරුවන් ගේ අමතර අවශ්‍යතාවයන් සඳහා සැරිසරන්නට සිදුවීම නිසා, සුරැකුම් වගකීමෙහි තීව්‍රතාවයද ඉතා ඉහළ විය. බොහෝ අවස්ථාවල එම කාන්තාවන්ට ශ්‍රම බලකාය හැර යන්නට සිදු වූ අතර, ඔවුන්ගේ ජීවිතය දරුවන් වටා ගෙවමින්, වැඩිදෙනෙකුට කුළුබඩු පැකට් කිරීම, ආහාර සැපයීම වැනි කුඩා පරිමාන ගෘහාශ්‍රිත ව්‍යාපෘති පමණක් පවත්වාගෙන යා හැකිවිය.

ශාරීරිකව, ආබාධ සහිත දරුවන් රැක බලා ගැනීමේ කාර්යය වෙහෙසකර වන අතර, මව්පියන්ට එම දරුවන්ගේ වර්ධනයෙහි සෑම අවස්ථාවකදීම අභියෝගයන්ට මුහුණ දෙන්නට සිදුවෙයි. තවදුරටත්, එම දරුවන් වැඩිහිටියන් බවට පත්වෙද්දී රැකබලා ගැනීමේ පීඩනයද තව දුරටත් වර්ධනය වෙයි. එම මව්වරුන් සඳහන් කළේ එවැනි දරුවන් වැඩිහිටි බවට පත්ව තනිවම ආහාර ගැනීමට හැකියාව දැක්වුව ද, වැසිකිලියට යාම, ස්නානය කිරීම වැනි අවස්ථාවල දී තවදුරටත් සහාය දිය යුතු බවයි. ඊට අමතරව, ආබාධිත වැඩිහිටි දරුවන් ඒ වනවිට භෞතිකව පාලනය කරගැනීම, විශේෂයෙන්ම වයසක කාන්තාවන්ට අපහසු වන්නේය.

## විධිමත් අංශයේ ළමා නිවාස හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන්:

කාන්තාවන් විධිමත් අංශයේ රැකියාවන් සොයා නොයාමට හා අවිධිමත් රැකියාවලට සම්බන්ධවීමට එක් ප්‍රධාන හේතුවක් වූයේ, ඔවුන්ගේ සුරැකුම් කටයුතු සඳහා අවිධිමත් අංශයේ රැකියාවලින් පිරිනැමූ නම්‍යශීලි බවයි. සම්මුඛ පරීක්ෂණය කළ විධිමත් අංශවල සේවය කළ අයවලුන් ළමා සුරැකුම සඳහා යම් පිළියමක් තිබුණ අතර (උදාහරණය - ආච්චිලා, සීයලා) ඔවුන්ට පූර්ණ කාලීන රැකියාවන් කරන්නට එය හැකියාව ලබා දුන්නේය. එහෙත් විධිමත් අංශය විසින් ළදරු සුරැකුම් මධ්‍යස්ථාන හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පහසුකම් සියලු කාර්ය මණ්ඩලයට - විශේෂයෙන් තේ සැපයීමට, පිරිසිදු කිරීමට කොන්ත්‍රාත්තුගත වී සිටින අයට ඇතුළුව-ලබා දුන්නේ නම්, එය මව්වරුන්ට අවිධිමත් අංශවලට පිටතින් රැකියා අවස්ථා සොයා යාමට අවස්ථාව ලබාදෙයි.

## සුරැකුම් සපයන්නන්ට සුරැකුම ලබා දීම:

ශ්‍රී ලංකාව ලෝකයේ අනෙකුත් ප්‍රදේශවල ක්‍රියාත්මක වන නව සුරැකුම් යටිතල පහසුකම් ආකෘති දෙස ද බැලිය යුතුය. එම රටවල පහසුකම් ළමා රැකවරණයෙන් ඔබ්බට විහිදෙන නමුත් මව්වරුන් සඳහා විවේකය සහ විවේකය සඳහා අවකාශයන් ද වේ. ඔවුන්ට පන්තියකට හෝ පාඨමාලාවකට ඇතුළත් වී තම දරුවන් රැකබලා ගන්නා අතරතුර ඔවුන්ගේ ධාරිතාවය වර්ධනය කර ගත හැකි අවකාශයන් ද වේ. අනෙකුත් වැඩිහිටියන් සමඟ සම්බන්ධ වී ප්‍රජාව ගොඩනැගීමට හෝ රජයේ සේවාවන් ලබා ගැනීමට අවකාශයන් ද වේ. සම්මුඛ පරීක්ෂණවල දී ඔවුන්ගේ සති අන්තයන් හෝ විවේක කාලය ගෙවනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳව විමසීමේ දී, කාන්තාවන් ලබාදුන් පිළිතුරු වූයේ තව දුරටත් තම දරුවන් හෝ පවුලට සම්බන්ධ කටයුතුවල යෙදෙන බවත්, ඉතා කලාතුරකින් තම පෞද්ගලික කටයුත්තක යෙදෙන බවත්ය. අපගේ පන්ති පක්ෂග්‍රාහිත්වය අපට මෙම කරුණු කම්කරු පන්ති ප්‍රජාවන් සඳහා විකල්පයන් ලෙස සිතන්නට ඉඩ නොදෙන අතර, කොලොම්බියාවේ බොගොටා වැනි නගර බොගොටා සුරැකුම් කොට්ඨාශ සමඟ පෙරමුණ ගනී (සිද්ධි අධ්‍යයනය 2 බලන්න). ප්‍රජාවන් අර්ථවත් ලෙස සැලසුමට සම්බන්ධ කර තබාගනිමින්, එවැනි ප්‍රතිපත්තීන් ක්‍රියාවෙහි යෙදවීම ප්‍රමුඛ වෙයි.

* සියලුම නම් නිර්නාමික කර ඇත.

## සිද්ධි අධ්‍යයනය 1: යෞවනයන් සඳහා සුරැකුම- පාසල් අධ්‍යාපනයෙන් පසු වැඩසටහන සුරැකුම් යටිතල පහසුකම් ලෙස

ශාන්ති*, කොළඹ ප්‍රමුඛ පිරිමි පාසලක ගුරු සේවයේ යෙදී සිටින අතර, 2003 වසරේ සිට ඇය තම නිවස අවට වත්තේ ළමුන්ට අමතර පන්ති පවත්වා ඇත. ඒ සඳහා ඉල්ලුම වර්ධනය වෙද්දී සිය නිවස තුළ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා, වසර කිහිපයකට පෙර ඇය පන්ති පැවැත්වීමට වත්තේ නිවසක් සිය සිසුන්ගේ සහාය ඇතිව සොයාගෙන ඇත. එම නිවස නිරන්තරව ගංවතුරට ගොදුරු වූ හෙයින් හා ඉඩකඩ ප්‍රමාණවත් නොවූ හෙයින් පසුව ඇය ප්‍රධාන මාර්ගයේ ස්ථිර දෙමහල් ගොඩනැගිල්ලකට පැමිණ ඇත.

වඩාත් යහපත් ස්ථානයකට පැමිණීමෙන් ඇයට තම පන්ති වඩාත් පුළුල් කර ගන්නට හැකි වී ඇති අතර, මේ වනවිට ඇය සිසුවන් 89 ක් ඊට ඇතුළත් කරගෙන ඇත. ඔවුන් අතුරින් 50 දෙනෙකු නියමිත ගෙවීම් සිදු කරන අතර, ඇය තවත් ගුරුවරුන් තිදෙනෙකු පන්ති පැවැත්වීම සඳහා බඳවාගෙන ඇත. අමතර පන්ති පවත්වන ආයතන බොහොමයක් සිදු කරන පරිදි, ඇය ඔවුන්ගෙන් 10% ක කොමිස් මුදලක් අයකර ගනී. වැඩි දියුණු කරන ලද පහසුකම් හේතුවෙන් ඇයට නගරයේ විවිධ කොටස්වලින්ද සිසුන් ආකර්ෂණය කර ගන්නට හැකි වී ඇති අතර, ඔවුන් වත්තේ සිටින ගෙවීම් සිදු කිරීමට නොහැකි සිසුන්ට සහනාධාරද ලබා දෙයි. 1 ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා සියලු විෂයයන් සඳහා පන්ති එහි පැවැත්වේ.

ආසන්න වත්ත සිට පැමිණෙන සිසුන් බොහොමයක්, අස්ථායී හා අනාරක්ෂිත නිවාස පරිසරයන් දරති. ශාන්ති විස්තර කළ පරිදි, බොහොමයක් සිසුන් පැමිණෙන නිවාසවල පියවරුන් නොමැතිවීම හා රැකියා විරහිත වීම නිසා, මව්වරුන් පවුලේ ආදායම් උපදවන්නන් වෙති. ඇතැම් සිසුන් සිය මව රටින් බැහැරව රැකියාවේ යෙදී සිටින හෙයින්, සිය සීයා සහ ආච්චි සමඟ වෙසෙති. ශාන්ති විස්තර කරන පරිදි, මව්වරුන් අතිශය පීඩනයක් දරමින් දරුවන් නිතර නොසලකා හරිනු ලබන අතර, අධික වෙහෙසක් හා මානසික කම්පනයක් දරමින් දරුවන්ට අවශ්‍ය ප්‍රමාණවත් ආරක්ෂාවක් හා අවධානයක් නොදෙති.

කෙසේ වුව ද, මෙම ප්‍රදේශයේ වත්තෙහි කාන්තාවන්ගේ ක්‍රියාකාරී සංගම් පවතින අතර, පදිංචිකරුවන් බොහොමයක් සමෘධි හා මේ වන විට අස්වැසුම වැනි සමාජ සහායන් ලබමින් කාන්තාවන්ගේ බැංකු ණය ද ලබා ගත හැකිව සිටිති. ඊට අමතරව, ඔවුන් ප්‍රාදේශීය දේශපාලකයන්ගේ දැඩි අවධානය ද ලබන අතර, ඔවුන්ගෙන් නොමිලේ අභ්‍යාස පොත් හා ලිපි ද්‍රව්‍ය ලබමින් මව්පියන්ගේ හා ශාන්තිගේ බරපැන අවම කර ගනිති. කෙසේ වුවද, දෙමව්පියන් අමතර පාසල් වියදම් හේතුවෙන් අපහසුතාවයට පත්ව සිටින අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දරුවන් විෂයය බාහිර ක්‍රියාකාරකම්වලට සහභාගිවීමට නෙහැකිව සිටිති.

ආයතනය වෙනත් බාහිර පන්ති ආයතනයන්වල සිදුවන ආකාරයෙන්ම විධිමත්ව පවත්වාගෙන යනු ලබන අතර, එය වරප්‍රසාද නොලත් තරුණයින් සඳහා ප්‍රජා අවකාශයක් ලෙස වැඩිවශයෙන් ක්‍රියාත්මක වෙයි. ළමයින් පාසල අවසන් වූ පසු පස්වරු 2 ට එහි පැමිණෙන අතර, ඔවුන්ගේ මව්වරුන් රැකියාවල යෙදි සිටින හෙයින් හා නිවාස පරිසරය ශබ්ද සහිත හා අස්ථාවර වන හෙයින් බොහෝවිට පස්වරු 10 දක්වා එහි රැඳී සිටිති. සිසුන් නිවාස ගැටළුවලින් ගැලවීම සඳහා හෝ එකිනෙකා සමඟ කාලය ගෙවීම සඳහා ඔවුන්ට පන්ති නොපැවැත්වෙන විට පවා එහි පැමිණෙති. 'පන්ති පැවැත්විමෙන් පසුව ඔවුන් ආපසු ගෙදර යැවීම අපහසුයි - සමහරවිට ඔවුන් මට කියනවා පන්තිය තව කාලයක් පවත්වන්න, ඒ ඔවුන්ට ගෙදර යන්න ආශාවක් නැති නිසා'. ආයතනය වත්තේ සිට පැමිණෙන ශිෂ්‍යයන් ට දෙවැනි නිවසක් වැනි වන අතර, ඇතැම් ළමයින් ගෙදර වැසිකිලියට වඩා, ආයතනයේ වැසිකිලිය භාවිතයට කැමැත්ත දක්වති. ශාන්ති විසින් අමතර පන්තිවලට අමතරව වෙනත් ක්‍රියාකාරකම් ද හඳුන්වා දී ඇත. ඇය පන්ති කාමර විවිධ උත්සව සඳහා සරසා, ළමා දිනය සඳහා ඇය සිනමා දර්ශනයක් පවත්වා, අයිස්ක්‍රීම් යන්ත්‍රයක් ද ළමුන් සඳහා ගෙන්වා ගෙන ඇත. ඇය ඔවුන් නගරය හරහා පිටතට කැඳවාගෙන යාම ද ආරම්භකර ඇති බව අපට පැවසූ අතර, ළමයින් විවේක පිළිබඳව සංකල්පයක් නොමැති පවුල්වලින් පැමිණෙන බවත්, විහාරමහා දේවි උද්‍යානය ඒ ආසන්නයේ තිබුනද, ඔවුන්

මෙතෙක් එහි පවා ගොස් නොමැති බව ද අවධාරණය කළාය.

එමෙන්ම ශාන්ති ළමයින් ආරක්ෂා කිරීම සඳහා ද වැදගත් කාර්යයක් ඉටු කරන්නීය. ඇය වැඩිමහල් දරුවන්ට, විශේෂයෙන්ම ගැහැණු දරුවන්ට, උපදේශන සිදු කරන අතර, එමඟින් ඔවුන් පාසලෙන් ඉවත්වීම, අනිසි ප්‍රයෝජන ගැනීම හා අනාරක්ෂිත තත්ත්වයන්ට ලක්වීම වලක්වා ඇත. එමෙන්ම එම බාහිර පන්ති ආයතනය ආරක්ෂිත ස්ථානයක් ලෙස තහවුරු කර ඇති අතර - උදාහරණයක් ලෙස, අමතර පන්ති සඳහා ස්ථානය භාවිතා කරන පිරිමි ගුරුවරුන් විවෘත කාමරයක පන්ති පැවැත්විය යුතුවන අතර, එය මාර්ගයේ සිට හා ඇය විසින් නිරීක්ෂණය කළ හැකිය.

ශාන්ති විසින් හඳුනාගත් පරිදි, මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ඇති විශාලතම බාධකය වන්නේ ඊට සුදුසු ස්ථානයක් සොයා ගැනීමයි. උදාහරණයක් ලෙස, ඇයගේ ව්‍යවසායේ ස්වරූපයට අනුව, අඩු කුලී ස්ථානයක් සොයාගනු වෙනුවට මේ වන විට ද රුපියල් 100,000 ක් මාසිකව ගෙවනු ලබයි. එම ස්ථානය ඇයට මුදල් සැපයිය හැකි සිසුන් ආකර්ශණය කර ගැනීමට සහාය වූ අතර, කුලිය ගෙවා ගැනීමට ලබාගෙන ඇති ණය මුදල ගෙවාගත හැකි බවට ඇයට විශ්වාසයක් පවතී.

ඊට අමතරව, මෙම ආකෘතිය ශාන්ති විසින් එයට කැප කල කාලය, උත්සාහය හා මෙහෙයවීම හේතුවෙන් තිරසාර ලෙස පවතියි. ඇය විසින් එම අමතර පන්ති ආයතනයට දරන ලද උත්සාහයන් සඳහා ගෙවීමක් නොලබන අතර, අමතර ආදායම් ලබා ගැනීමට ඇය පෞද්ගලික තනි පුද්ගල පන්ති ලබා දී ඇයගේ පාසලේ අමතර වගකීම් ද භාර ගෙන ඇත. ශාන්ති මෙම කටයුතු සඳහා දිරිමත් කරනු ලබන්නේ සමාජ වැඩ හා ප්‍රජා සේවාවන්ගේ ආචාර ධර්මයන් මගිනි. ඇය එම ආයතනයේ සති අන්තයන් ද ඇතුළුව දිනපතා වැඩ කරමින්, නිවාඩුවක් ද අවශ්‍ය හෙයින් පොහොය දිනවල පමණක් විවේකයක් ලබා ඇත. පාසල් නිවාඩු කාලය තුළ ආයතනයට පැමිණෙන සිසුන්ට ඇය දින කිහිපයක නිවාඩුවක් පමණක් ලබා දී ඇත. එහි තිරසර බව සඳහා අවශ්‍ය අතිමහත් පෞද්ගලික උත්සාහය හේතුවෙන් එවැනි ආයතන අකෘතියක් නැවත බිහි වේද යන්න අපැහැදිලි ය. ශාන්ති සඳහන් කරනු ලැබුවේ වාසි නොතකා කැපවන කුඩා කණ්ඩායමක් මඟින් එවැන්නක් නැවත බිහිවීමට ඉඩ පවතින බවයි.

කෙසේ වුවද, වෙනත් පාසල් කාලයෙන් පසු වැඩ සටහන්වලට ප්‍රයෝජනවත් විය හැකි බව මූලික සොයාගැනීම් කිහිපයකින් තහවුරු කර ගත හැකිය. පළමු කාරණය, තරුණ යෞවනයන්ට භාවිතා කළ හැකි ළමා සුරැකුම් මධ්‍යස්ථාන හා ප්‍රජා අවකාශයන් සඳහා ඉල්ලුමක් පවතී. දෙවැනිව, දරුවන් අමතර පන්ති සඳහා යැවීම අධ්‍යාපනික අවශ්‍යතාවයක් ලෙස තහවුරු වී ඇති හෙයින් දෙමාපියන් ඊට කැමැත්තක් දක්වති. අමතර පන්ති ආශ්‍රිතව සුරැකුම් පද්ධතියක් කේන්ද්‍රගත කිරීමෙන් එය මූල්‍යමය වශයෙන් තිරසාරබවට පත් කළ හැකි වන්නේ, දෙමාපියන් වෙනත් වියදම්වලට වඩා අමතර පන්තිවලට ගෙවීමට කැමැත්තක් දක්වන හෙයිනි. එමෙන්ම එය ශාස්තු ව්‍යුහයන් මඟින් සිසුන්ට සහනාධාර ලබා දීමේ හැකියාවක් ද විවෘත කරනු ලබයි. තෙවැනිව, ගුරුවරුන් සමාජයෙහි ඉතා ඉහළ ගෞරවයක් හා විශ්වාසයක් ලබන අතර, එනිසා ඔවුන්ට පසුබෑම් හෝ දෙමාපියන් ගේ තරවටු කිරීම් නොමැතිව ඔවුන්ගේ කාර්ය භාරය හා විෂයය පථය අධ්‍යාපනික නොවන ක්‍රියාකාරකම් වෙත වඩාත් පුළුල් කළ හැකිය.

සමාජ ආරක්ෂාවෙහි වැදගත් සංරචකයක් වන නිදහස් අධ්‍යාපනය, අමතර පංති මඟින් බාදනයට ලක් වෙමින් පවතියි. අඩු ආදායම්ලාභී නිවාසයන්ට ළමා සුරැකුම ලබා දීම සඳහා සෙවනැලි අධ්‍යාපන පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීම තිරසාර විසඳුමක් නොවේ. කෙසේවුවද, වෙනත් පසුපාසල් වැඩසටහන් සඳහා ව්‍යාවහාර කළ හැකි සොයා ගැනීම වන්නේ අධ්‍යාපන කටයුතු සඳහා තිබෙන නැඹුරුවයි. විශේෂයෙන්ම ඉංග්‍රීසි භාෂා පන්ති දෙමාපියන්ගේ අනුමැතිය ඇතිව යෞවනයින් ආකර්ෂණය කළ හැකි වන අතර එමඟින් ප්‍රජාවගේ විශ්වාසය හා පිළිගැනීම අනුව පුළුල් කළහැකි හා වැඩි දියුණු කළ හැකි වැඩසටහනකට පදනමක් ඇතිකර ගත හැකිය. මෙම සිද්ධි අධ්‍යයනයේ ප්‍රධාන දායකත්වය වන්නේ අමතර පන්ති, සුරැකුමක් ලෙස පුළුල් කළ යුතු බවට

තර්කයක් නොව, තිරසර ඉල්ලුම මඟින් සිදුවන ප්‍රජා සම්බන්ධවීම් මඟින් අවසානයේ සුරැකුමෙහි හා සහායෙහි විවිධාකාර යටිතල පහසුකම් නිර්මාණය වනු ඇත.

## සිද්ධි අධ්‍යයනය 2 : කොලොම්බියාවේ, බොගොටාහි සුරැකුම් ඒකක

බොගොටාව විසින්, දේශීය රජයක් විසින් සුරැකුම් කටයුතු සඳහා සහාය වීමට අදාළ උත්සායන් ක්‍රියාත්මක කළ හැකිවන්නේ කෙසේදැයි දැක්වීමට අද්විතීය උදාහරණයක් ලබා දෙයි. වැටුප් නොලබන සුරැකුම් වැඩ පිළිබඳ නව ආකාරයකින් සිතීමේ මානයක් ලෙස සුරැකුම් ඒකක පරිකල්පනය කරනු ලැබ ඇත්තේ එම නගරයේ පළමු කාන්තා නගරාධිපතිනිය ලෙස තෝරාගනු ලැබූ ක්ලෝඩියා ලොපෙස් විසිනි. නගරාධිපතිනිය පළමු ඒකකය විවෘත කිරීමේ දී විස්තර කළ පරිදි, මෙම ප්‍රවේශයෙහි අද්විතීය ලක්ෂණය වන්නේ "එය සුරැකීම හඳුනාගැනීම හා නැවත බෙදාහැරීම පිළිබඳව පමණක් නොව, එය ආයතනගත කර සුරැකුම් සපයන්නන්ට කාලය හා අවස්ථාවන් නිදහස් කර දීමටය". බොගොටා හි සුරැකුම් ඒකක නගරයේ විවිධ කලාපයන් හි ස්ථානගත කර ඇති අතර, එහි පැමිණෙන්නන්ට පාගමනින් පැමිණිය හැකි දුරකින් සැලසුම් කර ඇත. ආසන්නයේ පදිංචිව නොසිටින අයට නොමිලේ ප්‍රවාහන පහසුකම් ද සැපයේ. ඒවායේ යටිතල පහසුකම් සහ සේවාවන් සුරැකුම් සපයන්නන්ට හා සුරැකුම් ලබන්නන්ට ආසන්නව හා සමගාමීව ලබා දෙන අතර, එය සුරැකුම සහ උපායශීලී නාගරික සැලසුම්කරණය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් කරගත් දෘෂ්ටිකෝණයක් ඒකාබද්ධ කරන ඉඩම් පරිහරණ සැලසුම්කරණයක් අනුගමනය කරයි. සුරැකුම් ඒකක මහළු ජනතාවට, දරුවන්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට සුරැකුම් සේවාවන් නොමිලේ සපයා සුරැකුම් සපයන්නන්ට කාලය නිදහස් කර දෙයි. එහි ප්‍රතිපලයක් ලෙස සුරැකුම් සපයන්නන්ට සේවය සඳහා යාමට හැකිවෙනවා පමණක් නොව, ඔවුනට පන්තිවලට හෝ කුසලතා පුහුණුවලට සහභාගිවීමට, නොමිලේ රෙදිපිළි සෝදා ගැනීමට, පිහිනීමට හා වෙනත් විවේකීය ක්‍රියාකාරකම්වලට එක්වීමට අවස්ථාව ලැබේ. බොගෝටා නගරාණ්ඩුවට අනුව "2020 ඔක්තෝබර් හා 2023 මැයි මාසය අතර, බොගෝටා සුරැකුම් ඒකක 19 ක් සහ සුරැකුම් බස්රථ දෙකක්, ආරම්භකර ඇති අතර, එමඟින් 2021 මාර්තු මස සිට සේවාවන් 420,000 ක් ලබා දී ඇත. ඔවුන් විසින්, ජාතික පුහුණු සේවාව හා එක්ව කාන්තාවන් 12,000 කට වඩා පුහුණු කර ඇති අතර, (ස්පාඤ්ඤ භාෂාවෙන් SENA) 500 දෙනෙකුට ඔවුන්ගේ විද්‍යාලයීය උපාධිය සඳහා සහාය වී ඇත. ඊට අමතරව අප විසින් 86,000 දෙනෙකුට වඩා සුරැකුම් සපයන පිරිසකගේ ජීවිත පරිවර්තනය කරමින් ඔවුන්ට පළමු වරට විවේක ගැනීමට, අභ්‍යාසයට හා තම ස්වාධීනත්වය උසස් කර ගැනීමට අවස්ථාව ලබා දී ඇත. මෙම වැඩසටහන් ඇත්ත වශයෙන්ම පරිවර්තනීය කරන කාරණය වන්නේ, ඒවා නීතියට අන්තර්ගත කර තිබීමයි - බොගෝටා හි සුරැකුම් පද්ධතිය 2023 මාර්තු මාසයේ නාගරික නීතියක් බවට පත් වූ අතර, එමඟින් එහි පැමිණි පරිපාලනය තුළ සුරැකුම් පද්ධතියෙහි ඉදිරි පැවැත්ම, ස්ථිරභාවය සහ ව්‍යාප්තිය සහතික කෙරිනි.

*උපුටා ගැනීම : Moro 2024 and Observatory of Public Sector Innovation, 2022 and 2023*

## සිද්ධි අධ්‍යයනය 3 : ඉන්දියාවේ සේවක සහයෝගිතා ආකෘති

ස්වයං රැකියාවල නියුක්ත කාන්තාවන්ගේ සංගමය (Self-Employed Womenzs Association - SEWA) 1972 දී අවිධිමත් ආර්ථිකයෙහි කාන්තා කම්කරුවන් සඳහා වෘත්තීය සංගමයක් ලෙස ලියාපදිංචි කරන ලදි. එය මිලියන 2.1 ක සාමාජිකයින් සහිත, ඉන්දියාවෙහි ප්‍රාන්ත 18 ක කාන්තා කම්කරුවන් සංවිධානය කෙරෙන සංගමයක් මෙන්ම ව්‍යාපාරයක් ද විය. කායික කම්කරුවන් සහ කෘෂිකාර්මික කම්කරුවන්, ගෘහ සේවකයින්, මාර්ග දෙපස සිටින වෙළඳුන්, නිවාස පදනම් කරගත් සේවකයින් සහ කලා ශිල්පීන් වැනි සේවා දායකයින් SEWA හි සාමාජිකයින් සාමාජිකත්වයට ඇතුළත්ය. අවිධිමත් අංශයේ කාන්තා සේවකයින් ගේ දවසපුරා ළමා සුරැකුම සඳහා පැවති දැඩි අවශ්‍යතාවයට ප්‍රතිචාර දක්වමින් SEWA විසින් සංගිනි නම් වූ ළමා සුරැකුම් සංස්ථාවක් පිහිටුවන ලද අතර, එය SEWA සාමාජිකයින්ට ළමා සුරැකුම් කේන්ද්‍ර 11 ක් පවත්වාගෙන යනු ලබයි. මෙම ළමා සුරැකුම් කේන්ද්‍ර ඉන්දියාවේ අහමදාබාද් හි පූර්ණ කාලීනව ළමා සුරැකුම් සේවාවන්

පවත්වාගෙන යනු ලබයි. එම ස්ථාන පෙරවරු 9 සිට පස්වරු 5 දක්වා විවෘතව පවතින අතර, සති අන්තයන්හි දී, වයස අවු 6 දක්වා දරුවන් 350 කට ආහාර සේවා සපයයි. සෑම ස්ථානයකම උපරිමව ළමයින් 35 දෙනෙකු සිටින අතර, ළමා සුරැකුම් සේවකයින් බල්සේවිකාස් ලෙස නම් කර ඇත. බල්සේවිකාවන් ළමයින් සහ අවිධිමත් අංශයේ කාන්තා සේවකයින් අයත් ප්‍රජාවටම අයත් වෙති. සංගමය කොටස් හිමියන්ගෙන් සමන්විත වන අතර ඔවුන්, ළමා සුරකින සේවකයින් හා මව්වරුන් ඇතුළුව, එහි සේවා ලබන්නන්, කළමනාකරුවන්, හිමිකරුවන් වෙති. එය සෑම පස් වසරකටම වරක් ඡන්දයක් පවත්වමින් ප්‍රජාතන්ත්‍රවාදීව ක්‍රියාත්මක වන අතර, එහි දී මණ්ඩල සාමාජිකයින් හත් දෙනෙකු සිට නම දෙනෙකු දක්වා තෝරා ගැනෙති. මණ්ඩල සාමාජිකයින් සියලු දෙනා සංගමය සමඟ සේවය කරන බල්සේවිකාවන් වෙති. සංගමය විසින් සාමාන්‍ය ගාස්තුවක් මව්පියන්ගෙන් අයකරන අතර, පවුල් වෙත ඊට අමතර මූල්‍ය පීඩනයක් නොපවරන බවට සහතික වෙයි. දෙමව්පියන් විසින් ගෙවනු ලබන ගාස්තු මඟින් එක් දරුවකුගේ වියදමින් තුනෙන් එක් කොටසක් පමණක් ආවරණය වෙයි. පවත්වාගෙන යාමේ ඉතිරි වියදම් ප්‍රජා පරිත්‍යාග (ආහාර ද්‍රව්‍ය ආදිය), මුදල් දායකත්ව, රාජ්‍ය සහනාධාර ආදිය මඟින් ආවරණය කර ගැනෙයි. සන්ගිනි සංගමය ද ඉන්දියාවේ රක්ෂණ බැංකුවේ (Reserve Bank of India - RBI) සේවකයින්ට ළමා සුරැකුම් සේවාවන් ලබා දෙයි. ළමා සුරැකුම් කේන්ද්‍ර 11 සේවකයින් ගෙන් අය කර ගනු ලබන ගාස්තු ස්ථිර නොවන සේවකයන් ගේ දරුවන් සඳහා අය කරනු ලබන ගාස්තුවලට වඩා වැඩි වන අතර, එමඟින් උපයාගනු ලබන ආදායම අනෙකුත් කේන්ද්‍රයන් පවත්වාගෙන යාමට දරන වියදම් ආවරණ කර ගැනීමට උපකාර වේ.

උපුටා ගැනීම : *SEWA 2022*

## නිර්දේශය 2 - ගෘහාශ්‍රිත සේවකයන් ආරක්ෂාකර ගැනීම සඳහා නීති ශක්තිමත් කිරීම

ශ්‍රී ලංකාවේ ගෙවිය යුතු අවම වැටුප්, අංක 3/2016 දරණ ජාතික අවම සේවක වැටුප් පනත (National Minimum Wage of Workers Act) යටතේ පනවා ඇති අතර, සේවා දායකයන් විසින් සේවකයන්ට ඊට වඩා අඩු වැටුපක් ගෙවීම තහනම් වේ. එම වැටුප මසකට ශ්‍රී ලංකාවේ රුපියල් 17,500 ක් ලෙස අවම මට්ටමක පැවති අතර, 2024 අංක 43 දරන ජාතික අවම වේතනය (සංශෝධන) පනත මඟින් 2024 සැප්තැම්බර් සිට රුපියල් 27,000 ක් දක්වා වැඩි කරන ලදි (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය 2024).

කෙසේ වුවද, නීතිය ක්‍රියාත්මක වන්නේ වතු කම්කරුවන් සඳහා සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට පමණක් වන අතර, ගෘහ සේවකයින් ඇතුළු අවිධිමත් අංශයේ සේවකයින් වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සිදු නොවේ. අපගේ පර්යේෂණයේ දී, විශේෂයෙන්ම ගෘහ සේවාවන් සඳහා, දෛනික වැටුප්වල විශාල විවිධත්වයක් නිරීක්ෂණය කරන ලදි. එය රුපියල් 1000 - 2000 දක්වා විය. ගෘහ සේවකයින් මාතෘ හා අසනීප නිවාඩු, වැටුප් සහිත දෛනික නිවාඩු, විශ්‍රාම ප්‍රතිලාභ වැනි කම්කරු ආරක්ෂාවන් නොලබන අතර, ඔවුන්ගේ දෛනික හෝ මාසික ආදායම දිනපතා සේවය සඳහා පැමිණීමට හැකිවීම මත පමණක් පදනම් වේ. ඉන් අදහස් වන්නේ කාන්තාවන්, ගෘහස්ථ හා සුරැකුම් කටයුතු හේතුවෙන් විශේෂයෙන්ම අවදානමට ලක්වන බවයි.

මෙම සේවකයන් සඳහා ගත හැකි පරිවර්තනීය සමාජ ආරක්ෂක පියවරයන් අතරට අවම වැටුප් සීමා පැනවීමට කම්කරු නීති රාමුව ශක්තිමත් කිරීම, අනිවාර්ය වැටුප් ගෙවන නිවාඩු, මාතෘ ප්‍රතිලාභ, සේවාදායකයා සහ සේවකයා අතර කොන්ත්‍රාත්තු ආදිය ඇතුළත් වේ. දශකයට වැඩි කාලයක්, ශ්‍රී ලංකාවේ ගෘහස්ථ සේවක සංගමය ගෘහස්ථ සේවකයින් සඳහා නීතිමය ආරක්ෂාව ඉල්ලා ඇත. ඔවුන් නිර්දේශ කර ඇති ප්‍රධාන කරුණු වන්නේ, ගෘහස්ථ සේවකයින් වැටුප් මණ්ඩල ආඥා පනතට ඇතුල් කිරීම, ගෘහස්ථ සේවකයින් EPF/ETF (සේවක අර්ථසාධක අරමුදල/ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල) ට ඇතුල් කිරීම, ගෘහස්ථ සේවකයින් අවම වැටුප් නීතියට බඳවා ගැනීම ආදියයි. ජාතික සමාජ ආරක්ෂණ උපාය මාර්ගයන්ට, සමාජ ආරක්ෂණ මණ්ඩලය (SSB) යෝජනා ක්‍රමය ශක්තිමත් කිරීමට හා ව්‍යාප්ත කිරීමට සැලසුම් ඇතුළත් වන බවත්, ඒ මඟින් ස්වයං රැකියාවල නියුක්ත සහ ගෘහස්ථ සේවකයන් ඇතුළු අවිධිමත් අංශයන්ගේ

සේවකයන් ගේ ආකර්ශණය වැඩි දියුණු කළ ගත හැකි වන පරිදි බඳවා ගැනීමේ ක්‍රමවේද සරල කිරීම, සුදුසුකම් ලැබීමේ නිර්නායකයන් පුළුල් කිරීම කළ ඇති බවත් අප තවදුරටත් නිරීක්ෂණය කරමු. රටේ පිට පළාත්වලින් පැමිණ සිටින නේවාසික ගෘහස්ථ සේවකයන් සඳහා තවදුරටත් ආරක්ෂාවන් අවශ්‍ය වේ - ඒ ඔවුන්ගේ නිවාඩු අයිතිය ලබා ගැනීමට, යහළුවන් මුණ ගැසීමට රැකියා ස්ථානයෙන් බැහැර වීමට, ආගමික ස්ථානවලට යාමට ආදියට සහ නිවාසයට සීමා නොවී සිටීමටය.

ප්‍රජා කණ්ඩායම් සමඟ අපගේ සාකච්ඡාවල දී, එවැනි නීති බලාත්මක කිරීම සහ සේවකයින් හා සේවාදායකයන් අතර බල ගතිකත්වය ඉස්මතු කරන ලදි. අවධානය යොමු වූ එක් කරුණක් වූයේ මෙම අමතර ප්‍රතිලාභයන් ලබාදී වියදම් අධික වුවහොත්, සේවාදායකයන්ට ගෘහස්ථ සේවයන් සේවයෙහි යොදවන දින ගණන අඩු කිරීමට සිදුවනු ඇත යන්නයි. අවධානය යොමු වූ තව එක් කාරණයක් වූයේ, මෙම නීති හා ප්‍රතිපත්තීන්ට බැඳී නොසිටින සේවා දායකයන් සමඟ, තම රැකියාව අවදානමට ලක්කර නොගනිමින්, සේවකයින් හට සටන් වැදිය හැක්කේ කෙසේද යන්නයි.

අප නිර්දේශ කරනු ලබන්නේ, ගෘහස්ථ සේවකයින් සඳහා එවැනි නීති සඳහා උපදේශනය කිරීම හා ශක්තිමත් කිරීම සමඟ ම ගෞරවාන්විත සේවා හා ශ්‍රමය සහ ජීවන තත්ත්වයට සරිලන වැටුප් පිළිබඳ දැනුම වර්ධනයට ද අවශ්‍යතාවයක් පවතින බවයි. එමඟින් ගෘහස්ථ සේවකයින් (ඊට අමතරව, ගෘහස්ථව හා ව්‍යාපාරයන්ට සේවා ලබා දෙන වෙනත් අවිධිමත් අංශයේ සේවකයින් ට ද) විධිමත් අංශයේ සේවකයින් භුක්ති විඳින අයිතීන්ට සහ ආරක්ෂාවන්ටම හිමිකම් තිබෙනවා ය යන්න සාමාන්‍යකරණය කළ හැකිය. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට හා සුරැකුම් ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙමින්, (තම ශ්‍රමය මඟින් තම සේවාදායකයන් විධිමත් ශ්‍රම බලකායේ සහභාගී වීමට ඉඩ සලසමින්) ජීවිතය පුරාවට සේවය කර "විශ්‍රාමික වයසේ" ඔවුන් හට කිසිදු ඉතිරියක් හෝ විශ්‍රාම ප්‍රතිලාභ නොමැතිව සිටීම ඉතාමත් අසාධාරණ ආර්ථික ව්‍යුහයකි.

## නිර්දේශය 3 - විශ්වීය පාසල ආහාර වැඩසටහන

ප්‍රතිචාර දක්වන්නන් 45 ක් අතුරින් 19 දෙනෙකු ප්‍රකාශ කළේ අඩුම වශයෙන් එක් දරුවකු ඔවුන්ගේ පාසලෙන් නොමිලේ ආහාරයක් ලද බවයි. එම දරුවන් එවැනි වැඩසටහනක් සහිත පෙර පාසලකට නැතහොත්, එවැනි වැඩසටහන් 5 ශ්‍රේණිය හා ඉන් පහලට සීමා වී තිබෙන හෙයින්, ප්‍රාථමික පාසලකට ඇතුලත් වී සිටියහ. තම දරුවන් නොමිලේ ආහාර ලබා දෙන වැඩසටහන පවතින පෙර පාසලකට යැවූ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළේ, තම දරුවා එම පෙර පාසලට යැවීමට ප්‍රධාන හේතුවක් වූයේ එය බවත්, දෙමව්පියන්ට තම දරුවන්ට දිය යුතු මාලු, එළවලු, සහ පළතුරු වැනි පෝෂදායී ආහාරවල වියදම දරාගත නොහැකි බවත්ය. උදාහරනයක් ලෙස, අස්වැසුම ප්‍රතිලාභිනියක් වන වයිෂ්නාවි, නිතර පැය 24 ක කාලයක් සේවයේ යෙදෙන තේ ඇසුරුම් කර්මාන්ත ශාලාවක සේවිකාවියකි. කෙසේ වුවද ඇයගේ අඩු වයසේ දරුවන් දෙදෙනාම නොමිලේ ආහාර ලැබීම හේතුවෙන් ඔවුන්ගේ ආර්ථික තත්ත්වයට විශාල වෙනසක් සිදුවෙයි. ඔවුන් පූර්ව දැනුම් දීමක් නොමැති වැඩ වාරයන්හි සේවය කරන හෙයින්, ඔවුන්ගේ දරුවන් නිවසේ දී නිතර සෝයා සහ පරිප්පු ආහාරයට ගන්නා අතර කලාතුරකින් එළවලු ආහාරයට ගනිති. පළතුරු ආහාරයට ගන්නා එකම අවස්ථාව පාසලේ ආහාර වැඩසටහනේ දී පමණි.

පාසල් ආහාර වැඩසටහන්, රැකියාවල යෙදී සිටින මව්වරුන්ගේ කාලය ද ඉතිරි කර දෙයි. එක් මවක් සඳහන් කළේ, ඇයගේ දියණිය පාසල් යැවීමට පෙර ඇය සඳහා ආහාර පිසීම අවශ්‍ය නොවන හෙයින් උදෑසන 6.30 ට අවදිවන බවයි. තවදුරටත්, පෙර පර්යේෂණ පෙන්වා දී ඇත්තේ පාසල් විසින් දරුවන්ට ලබා දීමට මව්පියන් වෙත ආහාර ලැයිස්තුවක් පිළියෙල කර යවන බවත්, එම ලැයිස්තුවට අනුව දරුවන්ට ආහාර යැවීමේ දී, එයට අධික කාලයක් වැයවන බවත් පිළියෙල කිරීම මිල අධික බවත්ය (Colombo Urban Lab, 2023). පෙර පර්යේෂණය තව දුරටත් පෙන්වා දී ඇත්තේ, දෙමව්පියන් ඇතැම් විට එම ආහාර ලැයිස්තුවට අනුගතවීමට නොහැකි අවස්ථාවල දී තරවටු කිරීම හෝ ලැජ්ජාවට පත්වීම වලක්වා ගැනීමට, දරුවන්

පාසලට යැවීම සිදු නොකරන බවයි. රැකියාවල යෙදී සිටින මව්වරුන් බොහොමයක් ප්‍රකාශ කළේ ඔවුන් පූර්ණ කාලීනව සේවයෙහි යෙදී සිටින හෙයින්, තම වැඩිමල් දරුවනට පාසලේ ආපන ශාලාවෙන් යමක් මිළදී ගැනීමට මුදල් ලබාදුන් බවයි. පාසල් ආහාර වැඩසටහන දරුවන් සෞඛ්‍යමත් ආහාර වේලක් ලබා ගන්නා බව තහවුරු කරන අතර, එමඟින් මව්වරුන් සිය දවස පුරා සේවා කාලය තිබිය දී, අළුයම 4 ට අවදිව ආහාර පිළියෙල කිරීම වැළැක් වේ.

පෙර පාසල්වල නොමිලේ ලබා දෙන ආහාර වේල සඳහා කොළඹ මහ නගර සභාව විසින් සහාය දෙනු ලබන අතර, සෑම දරුවෙකුටම රුපියල් 100 ක මුදලක් ඒ සඳහා වැය කරනු ලබයි. ඒ සඳහා, සෑම සතියකම එකිනෙකට වෙනස් කෑම වේල් පහක් පාසල ආසන්නයේ ආහාර සපයන වෙළඳසැලකින් ලබා දෙනු ලබන අතර, බිත්තර සහ කැරට්, අල සමඟ කඩල, නූඩ්ල්ස් සමඟ බිත්තර, බත් සමඟ මැල්ලුම්, බැදපු හාල්මැස්සන් සහ පරිප්පු ඊට ඇතුළත්ය. ආහාර ලබා දෙනු ලබන දරුවන් සංඛ්‍යාව වාර්තාගත කෙරෙන අතර, ආහාරවල හා ආහාර අනුභව කරන දරුවන්ගේ ඡායාරූප රැගෙන මහ නගර සභාව වෙත යැවිය යුතුය. ආහාර වැඩසටහන් නිසි ආකාරයෙන් පවත්වාගෙන යනු ලබන බවට තහවුරු කර ගැනීමට මහ නගර සභා නිලධාරීන් පවා පැමිණියහ. පෙර පාසල් ගුරුවරුන් සඳහන් කළේ ඇතැම් දරුවන් පෙරපාසලට පැමිණීමට හේතු වූයේ එය බවත්, ඇතැම් දරුවන් තම මවට ගෙනගොස් දීම සඳහා ආහාර සඟවා ගැනීම පවා සිදුකළ බවයි.

ප්‍රතිචාර දක්වන්නන් කිහිපදෙනෙකු යෝජනා කළේ, නොමිලේ ලබා දෙන ආහාර වැඩසටහන ඉහළ ශ්‍රේණිවලට ද ව්‍යාප්ත කළ යුතු බවයි. නිරන්තරයෙන් නිරාහාරව සිටින යෞවන වයසේ දරුවන් වැඩි කැලරි ප්‍රමාණයක් හා පෝෂණය අවශ්‍යව සිටින බව ද සඳහන් විය. ක්ෂුද්‍ර පෝෂණ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට නිතර අසමත් යෞවන ගැහැණු දරුවන් සම්බන්ධයෙන් ද එම කාරණය බලපෑම් සිදු කරයි.

පාසල් ආහාර වැඩසටහන් මව්වරුන්ට රැකියා සපයන අවස්ථාවක් ලෙස ද සැලකිය හැකි අතර, එමඟින් ළමා සුරැකුමට සංසන්දනාත්මකව ස්ථාවර ආදායම් උපදවන මූලාශ්‍රයක් ලබා දෙයි. එය තවදුරටත්, සංතෘප්ත වෙළඳපලවල තරඟ කිරීමට සටන් කරන සහ සීමිත ලාභයක් සහිත නිවාස පදනම් කරගත් ආහාර සැපයුම් ව්‍යාපාරයන්ට වර්ධනය වීමට අවස්ථාවක් ලබා දෙමින්, සීමිත ලාභයක් ලබයි.

පාසල් ආහාර වැඩසටහන් සඳහා ආහාර සපයන්නන් තෝරාගනු ලබන්නේ ටෙන්ඩර් ක්‍රමවේදයකට අනුව වන අතර, එක් වසරක් සඳහා කොන්ත්‍රාත්තුව අත්සන් තැබෙයි. අනෝමා එම ක්‍රමවේදය කලාප අධ්‍යාපන කාර්යාලයෙහි යහලුවෙකු මඟින් අධ්‍යයනය කරන ලද අතර, අදාළ ටෙන්ඩර් පටිපාටිය හරහා පාසල් දෙකක් සඳහා කොන්ත්‍රාත්තු දෙකක් ලබා ගන්නා ලදි. ඇය තම සොයුරිය හා එක් අසල් වාසියෙකු සමඟ ව්‍යාපාරය පවත්වාගෙන යයි. ඔවුන්ට රුපියල් 110 ක මුදලක් එක් ආහාර වේලක් සඳහා ගෙවනු ලබන අතර, එයින් මසකට රුපියල් 200,000 - 300,000 අතර මුදලක් උපයනු ලබයි. ඔවුනට ප්‍රෝටීන් සඳහා සකස්කළ ආහාර වට්ටෝරුවක් දෙනු ලබන අතර, පළතුරු හා එළවලු ඒ අනුව තෝරා ගැනීමට නිදහස ඇත. සාමාන්‍ය ආහාර වට්ටෝරුවට ඇතුළත් වන්නේ, සහල්, පරිප්පු, ප්‍රෝටීන්, එළවලුවක්, කොළ ව්‍යංජනයක් සහ පළතුරු කොටසක් ආදියයි. එක් ආහාර වේලකට මෙම අවශ්‍යතාවයන් රුපියල් 110 න් සපුරා ගැනීම අපහසුවන අතර, විචලනය වන ආහාර නිෂ්පාදන මිල, ගෑස් භාවිතය, ප්‍රවාහනය ආදිය ඊට හේතු වෙයි. කෙසේවුව ද, අත්හදා බැලීම් හා දෝෂයන් මගහරවා ගැනීමෙන් අනෝමා රුපියල් 50,000 ක පමණ ලාභයක් උපයා ගැනීමට සමත් විය. ඔවුන් ලබාදෙන සෑම ආහාරයකම ඡායාරූපයක් කලාප අධ්‍යාපන කාර්යාලයට වට්ස් ඇප් මඟින් යවන අතර, විදුහල්පති, උප විදුහල්පති, එක් එක් පාසලේ අංශ ප්‍රධානි ආදීන්ට ද සතියකට වරක් එය යවනු ලැබ තත්ත්ව පාලනය තහවුරු වෙයි.

පාසල් ආහාර වැඩ සටහන මඟින් පාසල් දරුවනට ආහාර බෙදා දීම සාධාරණ ලෙස සහ ඉක්මනින් සිදුවිය යුතු හෙයින්, ඒ සඳහා ආහාර බෙදා දෙන්නන් ද පාසැල් දිනවල අවශ්‍ය වේ. ප්‍රතිචාර දක්වන්නන් දෙදෙනෙක්

ආහාර බෙදන්නන් ලෙස සේවයෙහි යෙදු වූ අතර, එමඟින් ඔවුන් දිනකට රුපියල් 300 - 500 අතර මුදලක් උපයා ගත්හ. ඔවුන් විශේෂයෙන් මෙම කටයුත්තට යොදාගනු ලැබුවේ, එය ළමා සුරැකුම් කටයුතු සඳහා හිතකර හෙයිනි. චමිලා සඳහන් කළේ, "මම උදේ පාන්දරින් වැඩට ගිහින් දවල් ගෙදර එනවා. ඒ නිසා මට මගේ දරුවන් අරගෙන අමතර පන්තිවලට එක්ක යන්න පුළුවන්. නැත්තම් මට දරුවන් පාසලට එක්ක යන්න කෙනෙක් සොයාගන්න වෙනවා. මමයි මගේ ස්වාමි පුරුෂයයි දෙන්නම රැකියා කරන නිසයි මම දවසකට රුපියල් 300 ක් වගේ පොඩි මුදලකට යන්නෙ. වෙනත් කිසි කෙනෙක් යන්නෙ නෑ වැඩ කරන්න, ඒ වගෙ සුළු මුදලකට" එම සේවය දිනකට පැය කිහිපයක් පමණක් වීම හේතුවෙන් අමිනාට, තම ඥාතියෙකු ගේ නිවසක රසකැවිලි සෑදීම හෝ වරින් වර පිරිසිදු කිරීම වැනි වෙනත් කෙටි කාල රැකියාවන්ට යා හැකි විය. එම ප්‍රතිචාර දැක්වූවන් දෙදෙනාම සඳහන් කළේ එම රැකියා තම දරුවන්ගේ පාසල් නිවාඩු කාල සමඟ ගලපා ගත් බවයි.

මෙවැනි පාසල් ආහාර වැඩසටහන් කාල වේලාව සහ කුසලතා නොමැතිකම හේතුවෙන් වෙනත් ආකාරයේ රැකියාවන්වල යෙදෙන්නට නොහැකිව සිටින මව්වරුන්ට ආදායම් මාර්ග ලබා දෙයි. පාසල් පරිසරය තුළ යම් ගෞරවනීය ඇඟවීමක් සහිත වන නිසා, මෙය සාම්ප්‍රදායික සහ අනම්‍ය ස්ත්‍රීපුරුෂභාවය පදනම් කරගත් සම්මතයන් සහිත ප්‍රජාවන් සඳහා ගැලපේ.

**Centre for a Smart Future** is an interdisciplinary public policy think tank based in Colombo, Sri Lanka with researchers, advisors, practitioners and partners around the world.

Our partners include Blue Resources Trust, London School of Economics, Biodiversity Sri Lanka, Environment Foundation Ltd, Good Life X, Institute of Development Studies U.K, SEVANATHA Urban Resource Center.

The urbanisation and cities theme at CSF is led by Colombo Urban Lab (CUL). **CUL** works towards equitable and sustainable cities in Sri Lanka by advocating for research driven policy making where the lived experiences of citizens form the basis of a city's development. It is a collaborative and interdisciplinary space, enabling connections between research, practice and public policy. Our research and advocacy themes include infrastructure, food environment, climate change, social security and public space.

@colombourbanlab
csf-asia.org/colombo-urban-lab